# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

46 වන කලාපය
2023 අප්‍රේල් - ජුනි

# RANAWARUNA



## ස්වේච්ඡා බළසේනාවේ 51 වන සේනාවිධායක

මේජර් ජෙනරාල් එස් යු එම් එන් මානගේ WWV RWP RSP psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සම්ප්‍රාප්තිය



# ස්වේච්ඡා බළසේනාවට පරිණත නායකත්වයක් ..

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 51 වන සේනාවිධායක ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා විජයබාහු පාබල රෙජිමේන්තුවේ වත්මන් කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස් යු එම් එන් මානගේ WWV RWP RSP psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ජුනි මස 09 වන දිනට යෙදුණු සුබ මොහොතින් රාජකාරි භාරගැනීම ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් ස්වේච්ඡා බළසේනා මුලස්ථාන කඳවුරු පරිශ්‍රයේදී සිදුවිය.





එහිදී ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP සහ ස්වේච්ඡා බළසේනා මූලික මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ඊ කේ ඩබ්ලිව් ජේ විජේසිරි RSP විසින් නව සේනාවිධායකතුමන් උණුසුම් ලෙස පිළිගනු ලැබූ අතර විජයබාහු පාබල රෙජිමේන්තුවේ හට පිරිස් විසින් පිරිනමන ලද කඳවුරු මුරයකින් හා අභිමානවත් සම්මාන මුරයකින් එතුමන් වෙත ගෞරවය පුදකරන ලදි.

අනතුරුව නව සේනාවිධායකතුමන් විසින් හට පිරිස් ආමන්ත්‍රණය කළ අතර තම රාජකාරී භාරගැනීම සනිටුහන් කිරීම සඳහා අඹ පැළයක් රෝපණය කරන ලදි. තම කෙටිකාලීන ධුරකාලය තුළ ස්වේච්ඡා බළසේනාවේ ප්‍රමිතීන් ඉහළ නංවමින් රාජකාරී කිරීමට අපේක්ෂා කරන බව එතුමන් වැඩිදුරටත් අවධාරණය කරන ලදි. මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදූ ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් හා රණක්ෂිතයට පත් රණවිරුවන් ගෞරවයෙන් සිහිපත් කළ අතර විශ්‍රාමික මෙන්ම වර්තමානයේ රාජකාරියෙහි නිරත සියලු ස්වේච්ඡා සාමාජිකයින් වෙත සිය සුභාශිංසන පිරිනමන ලදි.

වසර 35 කට අධික යුද හමුදා සේවා කාලයක් හිමි ක්‍රියාන්විත මෙන්ම අණ හා මාණ්ඩලික රාජකාරී අත්දැකීම් සහිත මෙම ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් ස්වේච්ඡා බළසේනාවෙහි සේනාවිධායක ලෙස පත්වීම, ස්වේච්ඡා සාමාජිකයන්ට ඉමහත් ගෞරවයක් සේ සලකන අතර ස්වේච්ඡා බළසේනාවේ ඉදිරි ප්‍රගමනයට ඔබතුමන්ගේ නායකත්වය හේතුවනු ඇතැයි අපේක්ෂා කරමු. නව සේනාවිධායකතුමනි, ඔබතුමන්ට රණවරුණ ඔස්සේ අපිද මෙසේ සුභාශිංසන එක්කර සිටිමු.













# 50 වැනි සේනාවිධායක තම සමරු සටහන තබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 50 වන සේනාවිධායක ලෙස රාජකාරි ඉටුකළ මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී තනතුරේ වැඩ භාරගැනීම සඳහා ඉකුත් ජුනි මස 05 වන දින සිය ධූරයෙන් සමුගන්නා ලදි.

සේනාවිධායකතුමන් ස්වේච්ඡා බළසේනාවේ 05 වන සේනාවිධායක වූ තම පියාගේ සමරු සටහන සහිත සමරු සටහන් පොතෙහි 50 වැනි සේනාවිධායක ලෙස තම සමරු සටහන තබා සියලු නිල තේපැන් සංග්‍රහයකටද සහභාගීවු අතර එතුමන් වෙත නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ජ්‍යේෂ්ඨ නිලධාරී විසින් සමරු තිලිණයක්ද පිරිනමන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව වෙනුවෙන් අමිල මෙහෙවරක් සිදු කළ ජ්‍යේෂ්ඨ නිලධාරීතුමනි, යුද්ධ හමුදාවේ තෙවන ජ්‍යේෂ්ඨතම නිලය වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී තනතුරේ රාජකාරි භාරගැනීම සඳහා නික්ම ගිය ඔබතුමන්ට සියලුම ස්වේච්ඡා සාමාජිකයන් වෙනුවෙන් රණවරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක්කර සිටින්නෙමු.






# ඒකක මට්ටමේ ඉදිරිපත්කිරීම් මාලාවක් ...






ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ සංකල්පයකට අනුව ස්වේච්ඡා නිලධාරීන්ගේ වෘත්තීය දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම මෙන්ම පරීක්‍ෂණක හැකියාව වැඩිදියුණු කිරීම, ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම හා සන්නිවේදන හැකියාව ඔප්නැංවීම අරමුණු කරගනිමින් ඉදිරිපත්කිරීම් මාලාවක් ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන්ගේ අධීක්‍ෂණය යටතේ එම වැඩසටහනෙහි මංගල ඉදිරිපත්කිරීම, මැයි මස 31 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී 3 වන ගැමුණු හේවා බළඇණියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදි.

**"ගෝලීය උණුසුම හා එහි බලපෑම අවම කිරීම සඳහා ගත හැකි පියවර"** යන මාතෘකාව යටතේ 3 වන ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී පී ඒ පී ඒ පී මඩිත්තපොල ඇතුළු ඒකක නිලධාරීන් සිව් දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලදි.

එහිදී සේනාවිධායකතුමන් විසින් එම ඉදිරිපත්කිරීම ඇගයීමට ලක්කරමින් අදහස් දැක්වූ අතර දුර්වලතා මඟහරවා ගනිමින් වෘත්තීය කුසලතාවන්ගෙන් යුක්තව සන්නිවේදන කුසලතා වර්ධනය කරගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදි. මෙම අවස්ථාව සඳහා මූලික මාණ්ඩලික නිලධාරී ඇතුළු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ නිලධාරිණියන් පිරිසක් සහභාගී වූහ.





# ස්වේච්ඡා බලසේනාව 142 වන සංවත්සරය සමරයි

සියවසකුත් අඩසියවසකට ආසන්න අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ස්වේච්ඡා බලසේනාවේ ඉතිහාසය පිළිබඳව විමසා බැලීමේදී, වර්ෂ 1881 ක් වූ අප්‍රේල් මස පළමු වන දින ලාංකිකයින් හා සුදු ජාතිකයින්ගේ එකතුවෙන් ස්වේච්ඡා හමුදාවක් (Ceylon Volunteers) නමින් ස්ථාපනය කරන ලද අතර එය ලංකාව තුළ ස්ථාපිත වූ ප්‍රථම පාබල බළඇණිය විය. "ලුතිනන් කර්නල් ජෝන් ස්කොට් ආමිටේජ්" එහි අණදෙන නිලධාරී වශයෙන් පත් කරන ලද අතර, එම බළඇණිය පාලනය වූයේ ලංකා ආණ්ඩුකාරවරයා යටතේය. ආරම්භයේදී පාබල බළඇණියක් වූ මෙය පසුව අශ්වාරෝහක කණ්ඩායමකින්, කාලතුවක්කු කණ්ඩායමකින්, ගිලන්මැසි කණ්ඩායමකින්, ඉංජිනේරු කණ්ඩායමකින් හා තූර්ය වාදක කණ්ඩායමකින් සමන්විතව එවක රටෙහි පැවති අවශ්‍යතා සම්පූර්ණ කරන ලදි.

එක් පාබල බළඇණියකින් ආරම්භ වූ සිලෝන් වොලන්ටියර්ස්, පසුව බළඇණි කිහිපයක් දක්වා වර්ධනය වීම හේතුවෙන් 1910 දී ලංකා ආරක්ෂක බලසේනාව (CEYLON DEFENCE FORCE) ලෙස නව්‍යකරණයට ලක් වූ අතර ලංකා ආරක්ෂක බලසේනා සාමාජිකයින් විදේශීය යුද කටයුතු වෙනුවෙන් දැක්වූ දායකත්වය නිසා වර්ෂ 1922 දී ලංකා පාබල හමුදාව, රාජකීය වර්ණයන්ගෙන් පිදුම් ලබන ලදි.

වර්ෂ 1949 දී යුද්ධ හමුදා පනත ස්ථාපිතවීමත් සමග ලංකා ආරක්ෂක පනත සංශෝධනය වූ අතර, ලංකා ආරක්ෂක බළකායේ ඒකක ස්වේච්ඡා හමුදාවේ ඒකක ලෙස ස්ථාපිත වෙමින් "ලංකා ස්වේච්ඡා බලසේනාව" (CEYLON VOLUNTEER FORCE) ලෙස අභිනව නාමකරණයකට ලක්විය.

වර්ෂ 1972 මැයි මස 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස එතෙක් පැවති ලංකා ස්වේච්ඡා බලසේනාව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව (SRI LANKA ARMY VOLUNTEER FORCE) ලෙස වර්තමානයේදී ව්‍යවහාර කරන නාමයට හිමිකම් කියන ලද්දේය.







මෙසේ විවිධ සන්ධිස්ථාන පසුකරමින් පියවරෙන් පියවර ගොඩනැගුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව සිය 142 වන සංවත්සරය අප්‍රේල් මස 01 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරන ලදි. එම සංවත්සරයට සමගාමීව මාර්තු මස 30 වන දින මැදවච්චිය ඇටබගස්කඩ ගෝසිංහ ආරණ්‍ය සේනාසනවාසී කැබිතිගොල්ලෑවේ අමරතිස්ස හිමියන් විසින් ධර්ම දේශනාමය පිංකමක් පැවැත්වූ අතර එදින දහවල සංඝගත දක්ෂිණාමය පිංකමක්ද සිදුකරන ලදි.

පසු දින හංවැල්ල සැඳෑසෙවණ වැඩිහිටි නිවාස භූමිය ශුද්ධ පවිත්‍ර කර වැඩිහිටියන් වෙත දිවා ආහාරය පිළිගැන්වීම සහ මහරගම අපේක්ෂා රෝහල් භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන කටයුතු සිදුකරන ලදි. එදා මෙදා තුර මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කිරීම, රණක්ෂිතයටපත් විරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම මෙන්ම විශ්‍රාමිකව සිටින හා වර්තමානයේ රාජකාරී කරන සියලුම සමාජිකයන්ට සෙත්පතා මෙම සංවත්සර පිංකම් මාලාව සංවිධානය කරන ලදි. එහි සුවිශේෂී අවස්ථා අප කැමරා කාචයේ මෙසේ සනිටුහන් විය.









# නවෝත්පාදන පුහුණු පාඨමාලාවේ තෙවන අදියර - සහතිකපත් ප්‍රදානය ...






හරිත සොල්දාදුවා යන සංකල්පය ශක්තිමත් කරමින් නිපුණතා සංවර්ධන හා නවෝත්පාදන පුහුණු පාඨමාලාවේ තුන්වන අදියරේ සහතිකපත් ප්‍රදානය අප්‍රේල් මස 27 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ගේ මූලිකත්වයෙන් සිදුකරන ලදි.

පුරා මාස 4 ක කාලයක් පැවති මෙම පාඨමාලාව අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් නවෝත්පාදන බිහිකිරීමේ අරමුණින් සැලසුම් කරන ලද අතර ක්ෂේත්‍ර චාරිකාවලින්ද සමන්විත විය. මෙය වෙල්ඩින් වැඩ, වඩු කර්මාන්තය වැනි විෂයන් ආවරණය කරමින්, කුසලතා සංවර්ධනය කරගනිමින් හා කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කර ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කර ගැනීමට ඉවහල් විය. එහි සහතිකපත් ප්‍රදානයට, ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ඇතුළු මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිල සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

# සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම ...




මෙවර අලුත් අවුරුදු සැමරුම් උත්සවය අප්‍රේල් මස 17 වන දින, ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ RSP VSV USP ndu ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කඳවුරු පරිශ්‍රයේදී පැවැත්විණි.

මෙහිදී යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සහ ස්වේච්ඡා බළසේනා සේනාවිධායකතුමන්ගේ අලුත් අවුරුදු සුබපැතුම් පණිවුඩ ලුතිනන් කර්නල් එන් ඩබ්ලිව් දහනායක ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් කියවූ අතර ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රාජකාරී කරන සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් අලුත් අවුරුදු ත්‍යාග පිරිනමන ලදි. අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයක් පැවැත් වූ අතර මෙම අවස්ථාව සඳහා නියෝජ්‍ය සේනාවිධායකතුමන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසුනිල සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.



# ස්වේච්ඡා ඒකකවල වාර්ෂික පාලන පරීක්ෂාව

ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර යටතේ ස්ථාපිත ස්වේච්ඡා ඒකකවල පාලන පරීක්ෂාව, ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

එහිදී 6 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 1 වන පුරෝගාමී බළකාය, 2 වන ශ්‍රී ලංකා යුද හමුදා සේවා බළකාය යන ඒකකවල පාලන පරීක්ෂාව පිළිවෙලින් මැයි මස 10, 11 සහ 12 යන තෙදින තුළ සිදු කරන ලදි.



ආරක්ෂක සේනා මූලස්ථානය බටහිර යටතේ ස්ථාපිත ඒකක අතුරින් ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකක විස්සක පරිපාලන ගැටලු පිළිබඳව පරීක්ෂා කළ අතර ඒවාට ගතහැකි ක්‍රියාමාර්ගද මෙහිදී සාකච්ඡා කරන ලදි. වර්තමාන ආර්ථික තත්වය සමගින් හමුදාවක් ලෙස ඒකකවල පාලන කටයුතු මෙන්ම සොල්දාදුවන් ලෙස විනය පවත්වා ගනිමින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබිණි.



එහිදී ඒකක වෙත පැමිණි නියෝජ්‍ය සේනාවිධායකතුමන් වෙත මුර පිරික්සුමකින් ආචාරය පුදකළ අතර, මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන මන්ත්‍රණ සභාවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්, ඒකක අණදෙන නිලධාරීන් මෙන්ම සෙසුනිල සාමාජිකයන් පිරිසක් සහභාගී වූහ.





# නව සේනාවිධායක ස්වේච්ඡා ඒකකවල අණදෙන නිලධාරීන් ඇමතීම ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 51 වන සේනාවිධායක මේජර් ජෙනරාල් එස් යූ එම් එන් මානගේ WWV RWP RSP psc විසින් ස්වේච්ඡා ඒකකවල අණදෙන නිලධාරීන් ඇමතීම, ජුනි මස 27 වන දින ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සිදුකරන ලදි. රටේ පවතින ආර්ථික තත්වය හමුවේ පවතින සම්පත් ඵලදායකව භාවිත කිරීම හා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව තුලනාත්මක සාකච්ඡාවක් මෙහිදී සිදුකරන ලදි.

යුද්ධ හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් වාර්තාවන මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම, රියඅනතුරු, ලිංගික අපයෝජන, සියදිවි නසාගැනීම්, සේවය අතහැරයාම වැනි කරුණු පිළිබඳව මෙහිදී අවධාරණය කළ සේනාවිධායකතුමන් සොල්දාදුවන්ගේ විනය පිළිබඳවද විශේෂයෙන් සඳහන් කරමින් අණදෙන නිලධාරී වගකීම් හා තමා යටතේ සිටින භටපිරිස්වල රක්‍ෂණ පහසුකම් ඇතුළු සුබසාධනය පිළිබඳව අණදෙන නිලධාරීන් දැනුවත් කරන ලදි.

මෙම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක එම් ටී කේ ආර් සිල්වා KSP ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූ අතර අණදෙන නිලධාරීන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම සාකච්ඡාවට එදිනට නොපැමිණි අණදෙන නිලධාරීන් විශාලන තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ විය.





# නිර්මාණ අසපුව ...

## මිලින වූ රෝස කුසුම ...

මායිම් ගමේ මුර වැට ළඟ
තල් අතු පැල ඇතුළෙ ඉඳන්
හොරෙන් හොරෙන් මට ඉඟි පෑ පුංචි අංජනා

තල් කොළවල තල් කුරෙන්
අසීරුවෙන් අකුරු ලියා
ආලවන්තකම පෙන්වපු පුංචි අංජනා

දවසක් මහ පිපුරුම් මැද
නුඹේ ගමම ගිනි ගත්දා
අසරණ මට බලන් ඉන්න උනා අංජනා

පහුවදාම පාන්දරින්
මම දිව්වා නුඹේ පැලට
තංගම්මා ළඟම වැටිලා උඹත් අංජනා

එඩිතර මගෙ මේ පපුවට
සෝදුක ඉවසන්න බැරුව
මම හැඬුවා තුරුළු කරන් පුංචි අංජනා

යාල්දේවි යාපනයට
හූ තියාන ආව දවසෙ
නුඹෙ මතකය කඳුළු උනේ පුංචි අංජනා

තල් අතු පැල ළඟ කඳවුර
ඉවත් කරන් යන දවසේ
උඹෙ පැල ළඟ මං අසරණ වුණා අංජනා

සෙ/එච්101113 සැරයන් විජේසිංහ එම්ජී
3(සෙව්) විපාරෙ

## උකස් කළ නුඹෙ දිවිය

සඳක් මෙන් දිළි මුහුණේ අවපැහැය ළැගුම්ගෙන
කොඳ කැකළු මුතුසිනා අමනාප වී ගිහින්
නුරා පිරි බැලුම්ලන, ඉඟිමරන දෙනෙත් යුග
බොර පැහැව ගිලී ඇත නැත එදා මෙන් දිස්නෙ

සොඳුරු වූ හැන්දෑවේ සඳ එළියෙ උණුහුමට
සෙනෙහසින් ළංවෙලා සුව විඳපු උරමඩලෙ
නැත සුවය එදා මෙන් සියොළඟම වියැළිලා
ජීවිතය උකස් කොට දුමෙන් ඇඳි සිතුවමට

මා මුවේ දිග මැනපු රතු දෙතොල් ගොළුවෙලා
වකගැසුණු දෙකොපුලේ අව පැහැ වූ ලවන් යුග,
වයස එතරම් නැතත් වයස්ගත පෙනුම ලැබූ
ළතෙත් වූ හද මඩලෙ අඳුරු සිතුවම් ඇඳපු

මත්වෙච්චි හීනයක තනිවෙච්චි හිමිසඳුනි
දුම්වලාවෙන් නුඹේ ලොවම හතරුස් කළත්
උකස් කළ නුඹෙ දිවිය සින්න වෙන්නට නොදී
රැකගනිමි හැමදාම නුඹට බැඳි ප්‍රේමයෙන්

මේජර් දිල්හාරා දිසානායක

## සැඟව ගිය සිනහව

තුහින මල් මාවතේ
දුව පැන්න කාලයේ
හද රැඳුණ සිනහවක
සිත්තමක් තව තිබේ

ගෙවී ගිය අතීතේ
මතක එකිනෙක අරන්
මැකී ගිය කතාවක්
අමුණන්න සොයමි මං

නිරෝධායන ඇඳේ
සීතලට ගුලිවෙලා
සිනා පිරි අතීතෙක
සිහිනයක් දකිමි මං

හැබෑවට හමුවුණත්
කාලයක් ගත වෙලා
සිනා දැක ගන්න බෑ
ආවරණ මුව වසා

සුරංග සෙනවිරත්න
රණවිරුණු පාඨක

# බදාදා පුහුණු දිනයට සමගාමීව සිය දැණුම හා

## ආතතියෙන් මිදීමට සංගීතමය චිකිත්සාව



අප්‍රේල් මස 19 වන බදාදා දින, **ආතති කළමනාකරණය තුළින් යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීම** පිළිබඳ දේශනය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP විසින් සිදුකරන ලදි.

මෙම දේශනය තුළින්, **සංගීතය ආතති කළමනාකරණ විෂය තුළ ධනාත්මකව භාවිත කළ හැකි බව** පෙන්වා දෙමින් සංගීත චිකිත්සාමය අත්දැකීමක් ලබා දුන් අතර, මේ සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසුනිල සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

## ගිනි අනතුරු වළකමු - දැනුවත් වෙමු

අප්‍රේල් මස 26 වන බදාදා දින **ගිනි නිවීම හා ගින්නෙන් ආරක්ෂාවීම පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රායෝගික දේශනයක්** දෙහිවල ගල්කිස්ස ගිනි නිවන දෙපාර්තමේන්තුවේ ගිනි නිවනභට කේ ඩී ආර් ඩී ගුණවර්ධන සහ එම් ඒ කේ පී ජයවර්ධන යන මහත්වරුන් විසින් පවත්වන ලදි.



ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP ගේ අධීක්‍ෂණය යටතේ සිදු කරනු ලැබූ මෙම වැඩසටහන තුළදී ගිනි වර්ග හඳුනා ගැනීම, ගිනි ආරක්‍ෂාව සහ මෙහෙයුම් කුසලතා පිළිබඳව ස්වේච්ඡා බළසේනා සමාජිකයන් දැනුවත් කරන ලදි. මේ සඳහා ස්වේච්ඡා බළසේනා පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් සිසිර කුමාර RSP ඇතුළු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## යුද හමුදා රෙගුලාසි පිළිබඳ දේශනයක්



ජුනි මස 21 වන බදාදා දින ස්වේච්ඡා බළසේනා මූලස්ථාන මාණ්ඩලික නිලධාරී I බඳවා ගැනීම්, ලුතිනන් කර්නල් එස් යු ඩබ්ලිව් විමලරත්න ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් විසින් **යුද හමුදා රෙගුලාසි** පිළිබඳ දේශනයක් ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සිදුකරන ලදි.

බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා වූ නීතිරීති සහ නියෝග පිළිබඳ ස්වේච්ඡා සාමාජිකයින් දැනුවත් කිරීම ආයතනයේ කාර්යක්‍ෂමතාවයට, සාධාරණත්වයට සහ සුමට ක්‍රියාකාරීත්වයට අත්වැලක් වන බව මෙහිදී අවධාරණය කරන ලදි. මෙම දේශනය සඳහා ස්වේච්ඡා බළසේනාවේ නිලධාරීන් සහ සෙසු නිල සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

# අත්දැකීම් බෙදා හදා ගනිමින්...

## ක්‍රීඩා අනතුරු වැළැක්වීම සහ කළමනාකරණය



බදාදා පුහුණු දින වැඩසටහන් මාලාවේ තවත් එක් දේශනයක් යුද හමුදා ක්‍රීඩා වෛද්‍ය හා භෞත චිකිත්සක අංශයේ මාණ්ඩලික නිලධාරී II මේජර් ඩබ්ලිව් කේ පී එස් බංඩාර විසින් **ක්‍රීඩා අනතුරු වැළැක්වීම සහ කළමනාකරණය** යන මාතෘකාව යටතේ ජූනි මස 14 වන දින සිදුකරන ලදි.

ක්‍රීඩාමය ක්‍රියාකාරකම්වලදී සිදුවිය හැකි අනතුරු මෙන්ම දියයුතු ප්‍රථමාධාර පිළිබඳව මෙම දේශනය තුළින් සාකච්ඡා කළ අතර, මේ සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිල සාමාජිකයන් පිරිසක් සහභාගී වූහ.

## නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සහ ළඟ තබාගැනීම පිළිබඳ නීතිමය රාමුව

මැයි මස 03 වන බදාදා පුහුණු දින **නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සහ ළඟ තබාගැනීම පිළිබඳ නීතිමය රාමුව** යන මාතෘකාව යටතේ ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරී II (නීති), මේජර් එච් එස් පී මෙන්ඩිස් ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් ස්වේච්ඡා සාමාජිකයන් දැනුවත් කරන ලදි.

මෙහිදී රටේ කීර්තිමත් සහ විනයකරුක සංවිධානයක සාමාජිකයන් ලෙස මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට හසු නොවී නීතිමය රාමුව යටතේ සුවපහසු දිවියක් ගතකිරීමට උපදෙස් ලබාදෙන ලදි. මෙම දේශනය සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් ඇතුළු සෙසුනිල සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.




## නීතිය, මනස හා සෙබළ විනය



මැයි මස 10 වන බදාදා පුහුණු දිනයේදී **සොල්දාදුවෙකුගේ හැසිරීම සහ ඇඳුම් පැළඳුම්** පිළිබඳ දේශනය ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලෙහි රෙජිමේන්තු සැරයන් මේජර් බළලත් නිලධාරී I පී ආර් එම් එම් බී පුස්සලමංකඩ විසින් සිදුකරන ලදි.

එසේම ආරක්‍ෂක සේනා මූලස්ථානය - බටහිර හා මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් **නීතියේ පැතිකඩ හා මනස** පිළිබඳව නීතිඥ මේධා ද අල්විස් මහත්මිය විසින් හා **මනස සිතක්** යන මාතෘකාව යටතේ කථිකාචාර්ය අමා දිසානායක මහත්මිය විසින් විශාලන තාක්ෂණය ඔස්සේ දේශන පවත්වන ලදි. මේ අවස්ථාව සඳහා සෙසුනිල සාමාජිකයන් විශාල පිරිසක් සහභාගී වූහ.



# අපේ හෙළබස නිවැරදිව හසුරුවමු.

## බසක මහිම මැවූ රස පද ඇසේයා ...

ලොව ඕනෑම භාෂාවක භාවිත වන වචනයක, වාක්‍යයක හෝ ප්‍රකාශනයක අරුත නිසි ලෙස වටහා ගැනීමට නම් එම භාෂාව අයත් සංස්කෘතිය පිළිබඳ අවබෝධය ඉතා වැදගත්ය. එසේම සිංහල භාෂාවද අපගේ සංස්කෘතිය හා බැඳුණු මනාවූ සංස්කෘතික උරුමයකින් පොහොසත්වූ අපූරු භාෂාවකි. පසුගිය කලාපයේ මෙන්ම මෙවරද වදන් කිහිපයක අරුත, අපගේ සංස්කෘතික සන්දර්භය ඇසුරින් වටහා ගැනීමට යම් උත්සාහයක යෙදේ.

**මොන කෙංගෙඩියද**

සාමාන්‍යයෙන් එදිනෙදා අප ව්‍යවහාර කරන වචනයක් ලෙස කෙංගෙඩිය යන්න හඳුන්වා දිය හැකි වුවද එහි අරුත හරි හැටි දන්නේදැයි සැකයක් නම් උපදී. එනම් නොදන්නා දෙයක් පිළිබඳව යම් තැනැත්තෙකු කතාබහ කරන විටෙකදී අසා සිටින අනිත් පුද්ගලයන් මොන කෙංගෙඩියක්ද ඔය කියන්නේ යනුවෙන් ප්‍රකාශ කරයි. ව්‍යවහාරය තුළ මෙවැනි වදනක් නිර්මාණය වීමට අදාළ අපූරු පසුබිමක් පවතින අතර එම පසුබිම පිළිබඳව විමසා බැලිය හැක.

සිංහල ගැමි සංස්කෘතිය තුළ වන ගැමි ගෙදර සැබැවින්ම ස්වයංපෝෂිතය. යල මහ දෙකන්නයේ වී අස්වැන්නෙන් අටුකොටු පුරවා ගෙන අවශ්‍ය එළවළු පලතුරු ගෙවත්තේ වවා ගන්නට පුරුදු වූ ගැමියා තම අතිරික්තය අන් අය සමග බෙදා හදා ගැනීමටද පුරුදුවී සිටීම අප සංස්කෘතියේ වටිනාකම තව තවත් වැඩිකරන්නකි.

එසේම පවුලේ කිරි අවශ්‍යතාව සපුරා ගැනීමට බොහෝවිට නිවසේම කිරිහරක් ඇතිකරන අතර ගෙවත්තේ කොනක ගවගාලක් පැවතීම ගැමි ගෙදරක දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. එම ගවයින් නිසා පස සාරවත් වන අතර නිරෝගී පරපුරක් බිහිවීමටද හේතු වේ. ඒ නිසාම ගවයා පිළිබඳව උතුරායන ඇල්මකින් පසුවන ගැමියා, ගවයා රෝගීවූ විට තම නිවසේ කෙනෙකු රෝගාතුර වූවා වැනි හැඟීමකින් කටයුතු කරයි. එහිදී ගමේ වෙදරාල ගවයා සුවපත් කිරීමට විවිධ බෙහෙත් ඖෂධ ලබාදෙයි. විශේෂයෙන්ම ගවයින්ට වැළඳෙන කුර රෝගයේදී වෙදරාල විසින් ලබාදෙන බෙහෙත් ද්‍රව්‍ය පොට්ටනියක් කොට ගවයාගේ බෙල්ලේ ගැටගැසීම සිදුකරයි. කෙමක් ලෙස එම කටයුත්ත සිදු කළ යුත්තේ කතා නොකරය. එසේ ගැටගසන බෙහෙත් පොට්ටනියේ ඇත්තේ කුමක්දැයි දන්නේ වෙදරාල පමණි. ගැමියා ඒ පිළිබඳ හාංකවිසියක් නොදනී. මෙසේ අන්තර්ගතය පිළිබඳව නොදන්නා ගැමියන් එම පොට්ටනිය කෙම්ගෙඩිය ලෙස හඳුන්වන ලදි. භාෂාවේ ව්‍යවහාරයත් සමග උච්චාරණය කිරීමේ පහසුව (සුඛෝච්චාරණය) නිසා කෙම්ගෙඩිය පසුකාලීනව කෙංගෙඩිය විය.

**කණාමදයා**

බොහෝවිට රහමෙර පානයට නැඹුරු වූවෙකු එහි පමණ ඉක්මවූ විටෙක සිය හැසිරීම දෙස බලා **අදත් කණාමදයා වගේ බීලා** යනුවෙන් ව්‍යවහාර කරනු අප අසා ඇත්තෙමු. එසේ කීවද එම වචනයෙහි අරුත අප බොහෝ දෙනෙකු නොදන්නවා විය හැකියි.

සාමාන්‍යයෙන් කණා යන්නෙන් ඇස්වල ආබාධ සහිත ඇස් නොපෙනෙන පුද්ගලයෙකු හඳුන්වයි. වරෙක කීර්ති ශ්‍රී රාජසිංහ රජු වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් පිළිබඳව **වැලිවිට කණා සස්නේ වචනවා යැයි ......** යනුවෙන් තරමක් ද්වේශ සහගතව ප්‍රකාශයක් කර ඇත්තේ උන්වහන්සේගේ එක් ඇසක් නොපෙනුණ නිසයි. මේ අරුත වර්තමානයේදීද කිසියම් වූ කටයුත්තක් අනුමාන වශයෙන් සිදුකළ විටෙක"කණාවට ගහලා දැම්මා. කණා ෂොට් එකක් තමයි වැදුනේ " යනුවෙන් ව්‍යවහාර කරයි.

එසේම කණාමදයා යන්නෙහි තවත් අරුතක් තමයි කැලේ ජීවත් වන ඇස් නොපෙනෙන මදකිපුණු අලියා යන්න. එම අලියාගේ ඇසේ පවතින දෝෂය නිසාම කෙළින් යාමට උත්සාහ කළද ගස් ගල්වල හැපෙමින් පීඩාවට ලක්වේ. ඒ අයුරින්ම වැඩි වශයෙන් රහමෙර පානය කළ පුද්ගලයින්ද කෙළින් යාමට කොතරම් උත්සාහ කළද ඇදයට යන්නේ ඇස් නොපෙනෙන්නෙකුගේ චර්යාව සිහියට නංවමිනි. ඒ නිසාම මදකිපුණු ඇස් නොපෙනෙන අලියා හඳුන්වන කණාමදයා යන්න එලෙස හැසිරෙන බීමත් තැනැත්තන්ටද භාවිතවීම වඩාත් උචිත වූවකි.

ව්‍යවහාරයේ වන මෙවැනි ඇතැම් වචන හා බැඳුණු පසුබිම නැතිනම් සංස්කෘතිය විසින් නිර්මාණය කළ අර්ථය මනාව හඳුනාගෙන එම වදන් අර්ථාවබෝධයෙන් යුතුව භාවිතා කිරීමට අපට හැකියාව ඇත. එවිට සිංහල සංස්කෘතියේ වන අනන්‍යතාවන් අපගේ අනාගත පරම්පරාව වෙත භාෂාව තුළින් නිවැරදිව විතැන් කිරීමට පිළිවන.



මේජර් දිල්හාරා දිසානායක ජාශිබ
BA sp (Hons), MA, PGDE,PGDC
Dip in Eng. Dip in Pali. Dip in Astr.
**ප්‍රකාශන අංශය - ශ්‍රීලංයුහසෙව්බමු**

## හිසට සෙවණක් අපේක්ෂාමට සවියක් ...

### 9 (සෙව්) ශ්‍රීලපාහ



පලාලි ප්‍රදේශයේ ස්ථාපිත 9 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් දායකත්වය සපයන ලද "පූර්ණ නිවාස" ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ඉදිකළ නව නිවස ඒකකයේ සෙ/18ඩී00740 ලා/කෝප්‍රල් නිමල් ශාන්ත ආර්එම් යන කොනොනි වෙත භාරදීම, ජුනි මස 11 වන දිනට යෙදුණ සුබ මොහොතින්, ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සී ඩී වීරසූරිය RWP RSP ndu ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින් සිදුකරන ලදි. ඒකක අණදෙන නිලධාරී මේජර් අයි එම් පී එන් ජයතිලක ඇතුළු සියලුම ඒකක සාමාජිකයන්ගේ මූල්‍යමය සහ ශ්‍රම දායකත්වය මත මෙම ඉදිකිරීම සිදුකරන ලදි.

## හිසට සෙවණක් නව නිවසක් ...



### 17 (සෙව්) ශ්‍රීලපාහ



දමිළ සිවිල් වැසියන් හා යුද්ධ හමුදාව අතර සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් 65 වන සේනාංක බලප්‍රදේශයේ ජීවත් වන සිවිල් ජනතාව වෙත නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියට අනුව තේවන්පිඩ්ඩි ග්‍රාමනිලධාරී වසමේ ජීවත්වූ අරුල් මරියසතුජාගේ පවුල වෙනුවෙන් ඉදිකළ නව නිවස එම පවුල වෙත භාරදීම, ජුනි මස 10 වන දින මේජර් ජෙනරාල් ඊ ඒ ඩී පී එදිරිසිංහ psc ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින් සිදුකරන ලදි. 17 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් එච් එම් ජේ ප්‍රේමතිලක RSP ඇතුළු ඒකක සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වය හා 651 වන බළසේනාධිපති කර්නල් එස් විජේසිරිවර්ධන RWP RSP ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සම්බන්ධීකරණය මත මෙය සිදුකරන ලදි.

### 3 (සෙව්) ශ්‍රීලංසිරෙ



## උද්‍යාන අලංකරණයට ඇගයීමක් ...



නුවරඑළිය ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන එක්ව වසරක් පාසා සංවිධානය කරනු ලබන 2023 වසන්ත සැණකෙලියේ උද්‍යාන අලංකරණ තරඟාවලියට සහභාගී වී කඳවුරු භූමියේ මල්වැට වෙනුවෙන් ප්‍රථම ස්ථානයද තෘණභූමිය හා උද්‍යානය වෙනුවෙන් දෙවන ස්ථානයද 3(සෙව්) සිංහ රෙජිමේන්තු උද්‍යානය වෙනුවෙන් හිමිකරගෙන ඇත.

## 17 (සෙව්) ශ්‍රීලපාහ



## 14 වන සංවත්සර සැමරුම ...



තුණුක්කායි ප්‍රදේශයේ ස්ථාපිත 17 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව, පසුගියදා යෙදුණු 14 වන බළඇණි දිනය වෙනුවෙන් අණදෙන නිලධාරී මේජර් එච් එම් පේ ප්‍රේමතිලක RSP වෙත කඳවුරු සම්මාන මුරයක් පැවැත්වූ අතර බළඇණි දිනය සිහිවීම සඳහා පැළයක්ද රෝපණය කරන ලදි. ඒකක සංවත්සරයට සමගාමීව ඒකක කණ්ඩායම් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වූ අතර එදින සන්ධ්‍යාවේ ධර්ම දේශනාමය පිංකමක්ද පසු දින සංඝගත දක්ෂිණාමය පිංකමක්ද පවත්වමින් බළඇණි සංවත්සරයට සුභාශිංසන එක්කරන ලදි.

## රණවිරු සැමරුමක්



## 3 (සෙව්) ශ්‍රීලංසිරෙ



නුවරඑළිය ප්‍රදේශයේ ස්ථාපිත 3(සෙව්) සිංහ රෙපිමේන්තුව විසින්, මැයි මස 18 වන දිනට යෙදුණු 14 වන විජයග්‍රාහී දිනයේදී රට දැය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් කඳවුර තුළ ස්ථාපිත රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදි. මේ අවස්ථාව සඳහා ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව් පී ටී ඩබ්ලිව් ඒ එම් ආර් පී එස් බෝයගොඩ RSP ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ පිදුරුතලාගල ගුවන් හමුදා කඳවුරේ අණදෙන නිලධාරී ගෲප් කපිතාන් එම් එච් එම් ඩී ඩී සී කේ බණ්ඩාර MSc psc ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගීවූ අතර, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් පී කේ පී ඒ ආර් කේ නන්දන මහතා, මෙන්ම රණවිරු පවුල්වල ඥාතීන් ඇතුළු සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් මෙම පුෂ්පෝපහාර පවත්වන ලදි.

## 16 (සෙව්) ගැහේබ



## ඔබේ දිරියට අපෙන් සවියක් ...




ශ්‍රී ලංකා ජාතික කාන්තා අවුරුදු 19 න් පහළ ක්‍රිකට් කණ්ඩායමට තේරී පත්වූ සෙල්වරාසා ක්‍රිස්ටිකා ක්‍රීඩිකාව හට නව නිවසක් ඉදිකර භාරදීම පසුගියදා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩී බී එස් එන් බෝතොට RWP RSP VSV USP ndu psc ගේ සුරතින් සිදුකරන ලදි. මේ සඳහා 16 වන ගැමුණු හේවා බළඇණි අණදෙන නිලධාරී මේජර් කේ ඩබ්ලිව් කේ හේමන්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම යටතේ ඒකක සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වය මත හා ප්‍රදේශයේ ධන පරිත්‍යාගශීලීන්ගේ මූල්‍ය දායකත්වය මත මෙම නිවස ඉදිකරන ලදි.

## සංවත්සර දින සැමරුම ...

11 (සෙව්) ශ්‍රීලංසිරෙ





මඩකලපුව කුරුක්කල්මඩම් ප්‍රදේශයේ ස්ථාපිත 11 (සෙව්) සිංහ රෙජිමේන්තුව විසින් අප්‍රේල් මස 16 වන දිනට යෙදුණු 29 වන ඒකක සංවත්සරය ඉතා උත්කර්ෂවත් ලෙස සමරන ලදි. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් ඩී එම් එන් පත්මසිරි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් වෙත සම්මාන මුරයකින් හා සම්මාන පෙළපාලියකින් ආචාරය පුද කරන ලදි. එසේම හීල්දානමය පිංකමක් හා එදින සැන්දෑවේ බෝධි පූජාමය පිංකමක් පැවැත් වූ අතර සංවත්සර දින සිහිවටනයක් ලෙස අණදෙන නිලධාරී විසින් පැළයක් ද රෝපණය කරන ලදි. සියලු නිලයින් සඳහා තේ පැන් සංග්‍රහයක් මෙන්ම සුහදතාව වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරගාවලියක්ද සංවත්සර දිනයට සමගාමීව සංවිධානය කරන ලදි.

## වෙරළ තීරය පිරිසිදු කිරීම ...

3 (සෙව්) ගැහේබ



එළියකන්ද සිට නිල්වලා ගඟෙහි මෝය දක්වා වූ කිලෝමීටර් 2 ක පමණ වන වෙරළ තීරය පිරිසිදු කිරීමේ කටයුතු මාතර කොටුවෙහි ස්ථාපිත 3 වන ගැමුණු හේවා බළඇණිය මගින් පසුගියදා සිදු කරන ලදි. 3 වන ගැමුණු හේවා බළඇණි අණදෙන නිලධාරීතුමන් මේජර් පී ඒ පී පී මඩිත්තපොල ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සහ 14 වන ගැමුණු හේවා බළඇණියේ නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ සිදු කළ මෙම සත්ක්‍රියාව සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පොලිස් අධිකාරී කාර්යාලය මාතර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුව, මාතර මහමායා බාලිකා විද්‍යාලය හා සාන්ත මරියා කන්‍යාරාමය යන ආයතනයන්හි සහයෝගයද ලබාදෙන ලදි.

## ජීවන බරට සහනයක් ...

15 (සෙව්) ගරෙ





කොඩිකාමම් ප්‍රදේශයේ ස්ථාපිත 15(සෙව්) බළඇණිය ගජබා රෙජිමේන්තුව විසින් තම බළප්‍රදේශයට අයත් අඩු ආදායම්ලාභී පවුල්වල ජීවත්වන ගැබිනි මාතාවන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීම ඒකක අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව් ආර් ප්‍රසන්න ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා ඒකක සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පසුගිය දින සිදුකරන ලදි.



**දශක තුනක යුද්ධය නිමවී වසර 14 කට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාබ භුක්ති විඳිමින් සමස්ත රටවැසියන්ම සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතරතුර රණවිරුවන්ද එතෙක් කළක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටී. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.**

**සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂීය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැඟේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය, සැක, දුක, වේදනාව හා සතුට හමුවේ ඔවුන් සිය ජීවිතවලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යමාන වේ. " පය අළි බිම ළය රැඳි මතක " තුළින් දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුන සුන්දර කතන්දරයි ...**

# වෙඩි වැදුණු එළදෙනට කවක් ....

2008 වසර අගභාගය වනවිට උතුරු යුදබිම බොහෝ සේ රත්වී තිබිණ. ත්‍රස්තවාදීන්ට එරෙහිව පෙරමුණු කිහිපයක් ඔස්සේ සටන් වදිමින් රණවිරුවෝ පෙරට ඇදෙමින් සිටියහ. එවකට මා සේවයේ නිරතව සිටියේ 4 වන කාර්ය සේනාංකය යටතේ 641 වන බළසේනාවේය. ඒ වන විට අලුතින් ආරම්භ කළ එම සේනාංකයට පැවරී තිබුණේ වැලිඔය සිට ඔටියමලේ, නැදුන්කර්නි, ඔඩ්ඩුසුඩාන් හරහා පුදුකඩ්ඉරිප්පු ප්‍රදේශය දක්වා බලය තහවුරු කිරීමය. එහිදී ඉදිරියට යන හමුදාව වෙත ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වූයේ ප්‍රබල ප්‍රතිවිරෝධයකි. එනමුත් හමුදාවේ ගමන නැවැත්වීමට තරම් එය ප්‍රමාණවත් නොවීය. අවසානයේ ත්‍රස්තවාදී අභියෝග අතික්‍රමණය කොට යුද හටයෝ සිය ඉලක්ක එකින් එක ජයගනිමින් පෙරටම ඇදුණහ.

ඉදිරි භූමියේ සටන් දිගින් දිගටම ඇවිළී යද්දී පෙර සටන් පැවැති භූමිය තුළ දිස්වූයේ නිහඬ බවකි. එකී නිහඬබව තුළ වුවද සැඟවුණු අවදානමක් තිබිය හැකි බැවින්, මුදාගත් සියලු බිම්කඩවල් යළි විමර්ශනය කිරීම අනිවාර්ය විය. අවදානමක් සඳහා අංශු මාත්‍රයක හෝ ඉඩක් නොතැබීම එහි අරමුණ විය. යුද භූමියෙහි නොසැලකිල්ල, අත්වැරදීම් හෝ ප්‍රමාද දෝෂ යනු ජීවිතවලින් වන්දි ගෙවන්නට සිදුවීමකි. ඒ පිළිබඳ ඕනෑවටත් වඩා අත්දැකීම් ඉතිහාසය තුළ වූ බැවින් ආරක්ෂාව හා පරිස්සම වෙනුවෙන් කිසිවෙකුත් සිය වගකීමෙන් නොමිදුනහ.

සටන් ඇවිළී ගිය ඔඩ්ඩුසුඩාන් හන්දිය අවට නිරීක්ෂණය කිරීමේදී එය නටඹුන් බවට පත්ව තිබූ අයුරු දිස්විය. බොහෝවිට යුද්ධයක් අවසානයේ අහිමි වන ජීවිත පිළිබඳ වැඩි දෙනෙකු කතා කළද ඊට නොදෙවෙනිව විනාශවන භෞතික පරිසරයද ගහකොළ හා සතා සිවුපාවුන් ගැනද එතරම් අවධානයට බඳුන් නොවීම සාමාන්‍ය තත්වයකි. කෙසේ හෝ ආරක්ෂාව තරකරමින් පෙරට යන ගමනේදී ඔඩ්ඩුසුඩාන් හන්දියෙහි යාබද මාර්ගයක් අසල වැටී සිටි එළදෙනක දැකීමෙන් මා තුළ හටගත්තේ කම්පනයකි. වෙඩි පහරවල් කිහිපයක් සිරුර පසාරුකොට ගෙන තිබුණද මියනොගොස් සිටි එම එළදෙන දෑස් හැර බලා සිටී. ඉරියව්ව දැනුදු මා මනසෙහි සිතුවමක් සේ මැවේ. කිසිවෙකුගේ හව්හරණක් නොමැතිව පණ අදිමින් සිටි එම එළදෙන දෙස කාගේ හෝ අවධානය යොමුවූවා දැයි නොදනී. පැවැති අවිනිශ්චිත වටපිටාව හමුවේ තිරිසනෙකුගේ නොව මිනිස් ජීවිතයක පවා ඉරණම, එක් නිමේෂයකින් තීරණය වන පසුබිමක් තුළ එය එසේ වූවා විය හැකිය.

එළදෙනට වෙඩි වැදීම කුමන පාර්ශවයක් අතින් සිදුවූවාදැයි නිගමනය කළ නොහැකි මුත් යුද වැදීමට වඩා දෙපාර්ශවයක යුද ගැටුමකට මැදිවීම කොතරම් අභාග්‍යයක්ද. මම මොහොතක් නතරව වැතිරී සිටි එළදෙන දෙස බැලීමි. ඇගේ ඇස්වල සටහන් වී තිබුණේ ආයාචනයකි. කුමක්දෝ කතාවක් කියන්නට එම සතා උත්සාහ දරන්නාක් මෙනි. නමුත් අවාසනාවකට එය තේරුම් ගැනීමට එහි කිසිවෙකුට ඉස්පාසුවක් නොවීය. එළඹෙන තීරණාත්මක මොහොතට මුහුණදීම උදෙසා සෑම අයෙක්ම ඉන් නික්ම යා යුතුමය. අවසානයේ එළදෙනගේ මුවට දිය පොදක් පමණක් වත්කළ මාද එතැනින් ඉවත්වූයේ අන් කළ හැකි කිසිවක් නොවූ නිසාමය.

තිරස්ව ඇදෙන වෙඩි උණ්ඩයක දුර තීරණය වන්නේ අවියේ ස්වභාවය අනුවය. ඉදිරියට යන උණ්ඩයකට මුණ ගැසෙන ඕනෑම දෙයක් විනිවිද යනු විනා එය සතුරා මිතුරා නොහඳුනයි. ගහක් කොළක් ගලක් වැනි භෞතික කිසිවක නොගැටෙන්නේ නම් එය නොනැවතී උපරිම දුර සීමාව දක්වා ගමන් කරයි. නමුත්, යුදබිම තුළ එසේ වෙඩි උණ්ඩයක් නිදහසේ ඉවත ඇදී යනුයේ කලාතුරකිනි. සතුරු මිතුරු පාර්ශව නොමැති බොහෝ තැන්වලදී ඒවා කෙළවර වන්නේ එම භූමියේම කොහේ හෝ සිටින සතෙකුගේ සිරුර විනිවිද යාමෙනි. සටන් බිම තුළ මියෙන තුවාලවන මිනිස් ජීවිත තරමටම අහිමි වූ සතා සිවුපාවුන් සංඛ්‍යාවද අතිමහත්ය. මුවන්, ඌරන්, හරකුන්, එළුවන්, වල්අලින් සේම පක්ෂීන්ද යුද්ධයේ අවාසනාවන්ත ඉරණමට වැඩි වශයෙන් ගොදුරු වූවන්ය.

යුද්ධයෙන් අහිමිවූ මිනිස් ජීවිත දැක අපි ඕනෑතරම් කම්පාවී ඇත්තෙමු. ඔවුනට උපහාර පුදන්නෙමු. අදටද ඔවුන් අනුස්මරණය කරන්නෙමු. නමුත් සංග්‍රාම භූමියේ සතුරු මිතුරු කිසිදු පාර්ශවයකට අයත් නොවී දිවි අහිමි වූ තිරිසනුන් පිළිබඳ කිසිවකු තුළ මතකයක් ඇත්දැයි නොදනිමු. ඉහත වෙඩි වැදුණු එළදෙන කියාපාන්නේ එකී සමස්ත තිරිසනුන්ගේ කතාවයි. වෙඩි උණ්ඩ හයක් වැදී ඉතා අසාධ්‍යව සිටියද ඒ මොහොතේත් මිය නොගොස් සිටි එම එළදෙන ඉන් මොහොතකට පසුව සදහටම දෑස් පියාගනු නොඅනුමානය. නමුත් එම සිදුවීම හරහා එම සතා අපගේ ඇස් සදහටම අරවා තබන්නට සමත්වී ඇති සෙයකි.

**පින්බිම බෙදන්නට වැතිරී ලේ විලක**
**උන් උන් මරාගෙන නොම ඉඳ එක පිලක**
**අං නැති එවුන් ගොංකං කරනා කලෙක**
**ගොං අපි කුමක් කරමුද මියයනු මිසක**

**කිරි දුන් කෙළෙහි ගුණ අමතක ලොව නරුම**
**තිරිසන් ගති පිරුණු මිනිසුන් ඇති තුරුම**
**බෙරිහන් දෙනු කුමට රැකගන්නට උරුම**
**වරිගෙන් ඉවත යම් පියවා පෙර කරුම**

**වැස්සෙයි රුහිරු බිඳු එකපිට එක පෙළට**
**ගැස්සෙයි හිතම තරහක් නැතිමුත් දුකට**
**ඉස්සෙයි පපුව හුස්මක අවසන් වරට**
**රස්නෙයි තවම හදවත නොදැනෙද නුඹට**



ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ
මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය



## 15 ශ්‍රීලංජාආබමු

## හිසට සෙවණක් නව නිවසක් ...





යාපනය ප්‍රදේශයේ ස්ථාපිත 15 වන ජාතික ආරක්ෂක බළමුළුව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුලකට නව නිවසක් ඉදිකර භාරදීම පසුගියදා ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය ආඥාපති මේජර් ජෙනරාල් එස් ආර් කේ හෙට්ටිආරච්චි RWP RSP VSV USP ndu psc ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි. ඒකක අණදෙන නිලධාරී මේජර් ඒ ඩී එස් ඩී අතුකෝරල ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මගපෙන්වීම යටතේ සියලු නිලයින්ගේ ශ්‍රමදායකත්වය මත හා ප්‍රදේශයේ දානපතියන්ගේ මූල්‍ය දායකත්වය මත මෙම නිවස ඉදිකරන ලදි.

## නව සායන ගොඩනැගිල්ලක් ...

## 11 (සේවි) ශ්‍රීලංසිරෙ





කුරුක්කල්මඩම් ප්‍රදේශයේ ස්ථාපිත 11 වන (සෙවි) සිංහ රෙජිමේන්තු ඒකක බළප්‍රදේශයේ ජීවත් වන ගැබිණි මව්වරුන් සහ ළදරුවන් වෙනුවෙන් සායන ගොඩනැගිල්ලක් ඉදිකර අදාළ නිලධාරීන් වෙත භාරදීම අප්‍රේල් මස 07 වන දින 231 පාබල බළසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව් එම් එන් කේ ඩී බංඩාර RWP RSP USP ndu නිලධාරීතුමන්ගේ සුරතින් සිදු කරන ලදි. එංගලන්තයේ සේවයේ නියුතු නදීර කහටපිටිය මහතා ඇතුළු මිතුරු කැළගේ ධන පරිත්‍යාගයෙන් හා ඒකක අණදෙන නිලධාරී මේජර් ඩී එම් එන් පත්මසිරි ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මගපෙන්වීම යටතේ ඒකක සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වයෙන් මෙම කාර්යය සිදු කරන ලදි. මේ අවස්ථාව සඳහා ඒකක නිලධාරීන් මෙන්ම සෙසුනිලයින් ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් ද සහභාගී වූහ.

## 5 ශ්‍රීලංජාආබමු

## රෙසැමේ නිල නිවස්නයක් ...





තන්තිරිමලය සෙත්සිරිගම ප්‍රදේශයේ ස්ථාපිත 5 වන ශ්‍රීලංජාආබමු ඒකකය ප්‍රාදේශීයව සපයාගත් අමුද්‍රව්‍ය යොදා ගනිමින් ඒකක සාමාජිකයින්ගේ දායකත්වය මත ඉදිකළ රෙසැමේ නිල නිවස්නය විවෘත කිරීම, ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒ පී ටී එස් අත්තනායක ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් අප්‍රේල් මස 11 වන දින සිදුකරන ලදි. මෙම අවස්ථාව සඳහා දෙවන අණදෙන නිලධාරී ඇතුළු ඒකක සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

## 17 (සෙව්) ශ්‍රීලංසිරෙ

## අපේ කමට අගයක් - හිසට සෙවණක් ...





වව්නියාව, පම්පෙමඩු ප්‍රදේශයේ ස්ථාපිත 17(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් ආසේමු (වන්නි) සුබසාධක වෙළඳසැලට අනුයුක්තව රාජකාරී කරනු ලබන එස් ශාන්තා මහත්මියගේ පවුල වෙනුවෙන් ඉදිකරන ලද නව නිවස විවෘත කිරීම ආසේමු වන්නි ආඥාපති මේජර් ජෙනරාල් සී ඩී රණසිංහ RWP RSP ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුකරන ලදි. මෙම අවස්ථාව සඳහා 56 වන පාබල සේනංකාධිපති, 562 පාබල බළසේනාධිපති, ඒකක අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## රුධිරය පරිත්‍යාග කිරීමේ පිංකමක් ...

## 15 (සෙව්) ගරෙ





කොඩිකාමම් ප්‍රදේශයේ ස්ථාපිත 15(සෙව්) ගජබා රෙජිමේන්තුවේ 26 වන සංවත්සර දිනයට සමගාමීව රුධිරය පරිත්‍යාග කිරීමේ පිංකමක් පසුගියදා සාර්ථකව සංවිධානය කරන ලදි. මෙම පිංකම ඒකක අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව් ආර් ප්‍රසන්න ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් හා යාපනය ශික්ෂණ රෝහලේ සම්බන්ධතාවයෙන් සිදුකළ අතර 52 වන පාබල සේනාංකයේ සියලුම ඒකකවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන්ද ඇතුළුව 79 දෙනෙකුගෙන් යුතු පිරිසක් මේ සඳහා දායක වූහ.

## 9 ශ්‍රීලංජාආබමු

## ඒකක සංචාරයක් ...





මුලතිව් ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත 68 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර් ඩබ්ලිව් පොන්නම්පෙරුම RSP psc ජ්‍යෙෂ්ඨ නිලධාරී පසුගියදා ඒකක සංචාරයක් සිදු කරන ලදි. සේනංකාධිපතිතුමන් තනතුරෙන් නික්මයාම නිමිත්තෙන් ඒකක භට පිරිස් ඇමතීමක්ද මෙහිදී සිදුකරන ලදි.

# ගිණුම්කරණයෙන්



**මේජර් ඩබ්ලිව් ඒ කේ ටී වික්‍රමසිංහ - ශ්‍රීලයුපොදුසේබ**
BB Mgt (Accountancy)Sp, MBA (Finance),
HNDA, CA Sri Lanka (Final Stage)
මානි I ගිණුම් - ශ්‍රීලංයුහසෙව්බමූ

## ගිණුම් මූලධර්ම සහ යුද්ධ හමුදා ගිණුම් (රාජ්‍ය නොවන ගිණුම්) අතර සම්බන්ධතාව ගොඩනැගීම

වර්තමානයේ අප භාවිත කරනු ලබන ගිණුම්කරණ ක්‍රියාවලියේ ලේඛනගත ඉතිහාසය ක්‍රි:ව: 1494 වර්ෂය දක්වා දිවයන අතර මෙම තොරතුරු ඉදිරිපත් කිරීමේ කලාව නැතිනම් ගිණුම්කරණයේ ප්‍රධාන මූලධර්මය වන ද්විත්ව සටහන් න්‍යාය (Double Entry System) ක්‍රි:ව: 1494 වර්ෂයේ ඉතාලි ජාතික ලූකා පැසියෝලි පියතුමා (Luca Pacioli) විසින් හඳුන්වා දුන් බවට ඓතිහාසික සාක්ෂි ඇත.



ඉතාලි ජාතික ලූකා පැසියෝලි පියතුමා (Luca Pacioli) (ක්‍රි:ව: 1494 වර්ෂය)

සියලුම ගනුදෙනුවල හා සිදුවීම්වල මූල්‍යමය බලපෑම ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් තැබීම එසේ නොමැති නම් යම් ආයතනයක් සතු අයිතිය නැත්නම් වත්කම් හා වගකීම්වල සිදුවන වෙනස්වීම් සෑම විටම සමපාත වන ලෙස සටහන් කිරීම මෙහිදී සිදුකරයි. අපගේ විෂයට අදාළව භාවිත වන ප්‍රධාන පොත් කට්ටලය වන යුද හමුදා පොත 21 (ARMY BOOK 21) හි ලැබීම් පැත්ත (යුපොහි වම් පැත්ත) සහ ගෙවීම් පැත්ත (යුපොහි දකුණු පැත්ත) යන දෙපැත්තෙහි සටහන් කරන ආකාරය අනුව ඉතාමත් සරල නිදසුනක් මඟින් පැහැදිලි කළ හැක. එනම් යුපො 21 හි ලැබීම් පැත්ත තුළ දේපළවලට අදාළ වන සටහන් සහ වැයදැරීම්වලට අදාළ වන සටහන් තැබීම් විමසිය හැක.

උදා :- රුඃ 10,000.00 ක් වටිනා TV යන්ත්‍රයක් මිලදී ගැනීම


**යුපො 21 (AB 21)**

| ලැබීම් | | | | | | | | | | | | | | | | | | | | | ගෙවීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | මුදල් 1 | බැංකු 2 | පොදු 3 | දේපල 4 | 5 | 6 | 7 | ණයකරු 8 | ණයහිමි 9 | දිනය | විස්තරය | මුදල් 1 | බැංකු 2 | පොදු 3 | දේපල 4 | 5 | 6 | 7 | ණයකරු 8 | ණයහිමි 9 |
| 01.01.2023 | ✓ | | | | 10,000.00 | | | | | | 01.01.2023 | TV යන්ත්‍රය | 10,000.00 | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

මෙහිදී අපගේ ගිණුම් වෙතින් රුඃ 10,000.00 ක මුදලක් (බැංකු හෝ මුදල්) බාහිර ආයතනයක් වෙත ලබා දෙන අතර එය අපගේ යුපො 21 හි ගෙවීම් පැත්තේ මුදල් හෝ බැංකු තීරුවේ සටහන් තැබීමත් එම මුදලට අදාළ TV යන්ත්‍රය අප හට ලැබීම සටහන් කිරීමත් ලැබීම් පැත්තේ දේපළ තීරුවේ සටහන් කිරීමත් තුළින් ගනුදෙනුවේ සටහන් තැබීම සම්පූර්ණ වේ
එය න්‍යායාත්මකව :

**වත්කම් = වගකීම්**

**(මුදල් වත්කම අඩුවී දේපළ වත්කම් වැඩිවීම) = (වගකීම්වලට බලපෑමක් ඇති නොවේ)**
**මුදල් වත්කම 10000.00 කින් අඩු වේ.**
**TV යන්ත්‍රය මඟින් දේපළ වත්කම රුඃ 10000.00 කින් වැඩි වේ.**



ඉහත සටහන් කිරීමට අනුව ගිණුමේ/ආයතනයේ සමස්ත වටිනාකමේ වෙනසක් සිදු නොවන අතර ගනුදෙනුව අවසානයේ වත්කම් හා වගකීම් ශේෂ තුලනයවීම සිදු වේ.



# සොඳුරු නිවසක් සඳහා ...

08 වන කොටස

## නිවසක සැලැස්ම - සොඳුරු නිවසක ආරම්භය

නිවාස ඉදිකිරීමට සූදානම් වන සියල්ලන්ගේම අවධානයට යොමු කිරීම සඳහා පොදුවේ නිවසක් ඉදිකිරීම හා බැඳුනු අතිශය සාමාන්‍ය කරුණු කිහිපයක් පිළිබඳව ඉදිරිපත් කිරීම වැදගත්යැයි හැඟේ.

- තෝරාගත් ඉඩම මැනුම් කටයුතු කර නියමිත මායිම් සැලසුම් කර ගත යුතුයි.
- ගෙපල නිසි ලෙස සකස් කර ගත යුතු වේ.
- ඉඩම එකම මට්ටමකට සකස්කර ගැනීමේදී ඉඩමේ ඉහළින් කැපෙන පස් පහතින් ඇති ස්ථානයට පහසුවෙන් පුරවා ගැනීමට හැකියාව ලැබීම.
- ඉඩම වෙත ඇතුළු වන මාර්ගයේ ගැටලු ඇත්නම් එයද නිවස සෑදීමට පෙර අවසන්ව තිබිය යුතුය. නැතිනම් නිවස පටන් ගැනීමේදී අවට පුද්ගලයන්ගෙන් ප්‍රශ්න ඇතිවිය හැක.
- ගෘහ සැලසුම නිත්‍යනුකූල ලෙසම කළ හැකි කෙනෙකු ලවා කරවා ගැනීමද වැදගත්ය.
- වාස්තු විද්‍යාව පිළිබඳ දැනුමක් ඇති සැලසුම් ශිල්පියෙකු ලවා නිර්මාණය කර ගැනීමද වැදගත්ය.
- තම ආර්ථිකයට ඔරොත්තු දෙන පරිදි සාමාන්‍ය සැලැස්මක් සකස්කර ගැනීමද වඩා උචිතය.
- අදින ලද සැලැස්ම සඳහා රජයේ අනුමැතිය ලබා ගත යුතුය.
- නායයෑම් ප්‍රදේශවල, ගංගා ඇළ දොළ මුහුදු අසල ඉඩම් පිළිබඳ පිළිගත් ඉංජිනේරුවරයෙකුගේ සේවාව ලබා ගැනීම.
- මහල් දෙක තුනකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීමේදී බලයලත් ඉංජිනේරුවරයෙකුගේ සේවාව ලබාගත යුතුය.

වාස්තු විද්‍යාව ආරම්භ වු භාරතයේ (ඉන්දියාවේ) ගවයා ඉතා ගෞරවයෙන් යුතුව හදා වඩා ගැනීම එම රටේ සංස්කෘතික ගුණයකි. ගවයා නිවෙස් ආශ්‍රිතව ජීවත්වීම සුබ යැයි පැරණි මතයක් ඇත. තවද ගවයාගේ ගොම බිමට ඉසීමෙන් බිමේ පිරිසිදු බව ඇතිවන බව අදටද ඉන්දියානු සංස්කෘතික පිළිගැනීමයි. ගොමවල විෂබීජ හරණීය බලයක් ඇති බවද ඇතැමෙකුගේ විශ්වාසයකි. ඉඩමේ ගවයා නිතර රැඳී සිටින දිශාවට වන්නට නිවසේ නිදන කාමරය සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය බව ඉන්දියාවේ පැරන්නන්ගේ මතයයි.



**කපිතන් චාමර පෙරේරා (විශ්‍රාමික)**
**ගෘහ සැලසුම් ශිල්පි**
**වාස්තු උපදේශක**
**(කැළණිය විශ්වවිද්‍යාලය)**



## 11 (සේවා) ශ්‍රීලංසිරෙ

## සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ...





ආගමික සංහිඳියාව වර්ධනය කිරීම වෙනුවෙන් බක්මහ උළෙලක් හා සංගීත ප්‍රසංගයක් අප්‍රේල් මස 30 වන දින කුරුක්කල්මඩම් ප්‍රදේශයේ ස්ථාපිත 11(සේවා) ශ්‍රීලංසිරෙ ඒකකය, 231 පාබල බළසේනාව, මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා පොලීසිය සමඟ එක්ව මඩකලපුව වේබර් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි. අන්තර් ආගමික සාම සංවිධානය මේ සඳහා විශේෂ අනුග්‍රහය දැක්වූ අතර මඩකලපුව පොලීසිය හා පැවති කඹ ඇදීමේ තරගයේ ජයග්‍රහණය 11(සේවා) ශ්‍රීලංසිරෙ ඒකකයට හිමි විය. 231 පාබල බළසේනාධිපති බ්‍රිගේඩියර් දිලූප බණ්ඩාර ජ්‍යෙෂ්ඨ නිලධාරී හා මඩකලපුව දිස්ත්‍රික් ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම බක්මහ උළෙල හා ප්‍රසංගයට 11(සේවා) ශ්‍රීලංසිරෙ ඒකක අණදෙන නිලධාරී මේජර් නිමල් පත්මසිරි ඇතුළු නිලධාරීන් හා සෙසුනිල සමාජිකයින් පිරිසක් මෙන්ම ප්‍රදේශයේ ජනතාව සහභාගී වූහ.

## කඳවුරු නිරීක්ෂණ සංචාරය ...

## 9 ශ්‍රීලංජාආබමු





මුලතිව් ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙත 68 වන සේනාංකාධිපති ලෙස වැඩ භාරගත් මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලිගේ RSP ndc psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්, කඳවුරු නිරීක්ෂණ සංචාරය අප්‍රේල් මස 02 වන දින සිදුකරන ලදි. යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයකින් එතුමන් පිළිගත් අතර පැළ රෝපණයක්ද එතුමන්ගේ සුරතින් සිදුකෙරිණ. ඒකක අණදෙන නිලධාරී මේජර් එච් පී අයි කුමාර ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුළු නිලධාරීන් සහ ඒකක හටපිරිස් මෙම අවස්ථාව සඳහා එක්වූහ.

## 10 ශ්‍රීලංජාආබමු

## නිල ඇඳුමින් සමාජ මාධ්‍ය භාවිතය ...





බත්තරමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් අයි පී ආර් ධම්මික ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් තම ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරී හා සෙසුනිල සාමාජිකයන්ට යුද්ධ හමුදා විනය, මත්ද්‍රව්‍ය භාවිත කිරීම සඳහා පෙළඹීම සහ යුද්ධ හමුදා ඇඳුමින් සැරසී සමාජ මාධ්‍ය තුළ ඡායාරූප ඇතුළත් කිරීම පිළිබඳව හරවත් දේශනයක් සංවිධානය කරන ලදි. 1 වන ශ්‍රීලයුපොහේබ අණදෙන නිලධාරී මේජර් ඊ ඩබ්ලිව් එච් එස් එරමුදුගොල්ල USP psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් මෙම හරවත් දේශනය පවත්වන ලදි.



# විරු උක්කාවාචාර

## 40 වන කලාපයේ සිට ගෙනඑන විරු පදක්කම් ....



**උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම**

වර්ෂ 2007 පෙබරවාරි මස 26 වන දින සිට වර්ෂ 2009 මැයි මස 18 වන දින දක්වා කාලය තුළ උතුරු මානුෂීය මෙහෙයුමට ක්‍රියාකාරීව සහභාගී වූ සක්‍රීය සේවයේ නිරත හමුදා සාමාජිකයින් ඇතුළු සිවිල් වෛද්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය, උතුරු ප්‍රදේශයේ සේවයේ කරන ලද සිවිල් පුද්ගලයින් වෙත මෙම පදක්කම පිරිනමයි. සන්දාරය - උතුරු ප්‍රදේශයේ දින 90 ට නොඅඩුව සේවයේ යෙදී සිටි, සටනේ නිරත වන ලද හා මෙහෙයුමට නන් අයුරින් සක්‍රීයව දායක වන ලද අයවළුන් වෙත සන්දාරය ප්‍රදානය කරනු ලැබේ. (වර්තමානයේදී මෙම පදක්කම ප්‍රදානය කරනු නොලැබේ.)



**පූර්ණ භූමි පදක්කම**

1977 ජූලි මස 22 වන දින සිට යාපනය දිස්ත්‍රික්කයේද, 1983 සැප්තැම්බර් මස 16 වන දින සිට වව්නියා, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්කවල ද, දින 180 ක කාලයක් සක්‍රීයව සේවය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික හා ගුවන් හමුදාවල නිත්‍ය හා ස්වේච්ඡා බළසේනාවන්ට අයත් සෑම තරාතිරමකම පුද්ගලයන් වෙත මෙම පදක්කම ප්‍රදානය කරයි. (වර්තමානයේදී මෙම පදක්කම ප්‍රදානය කරනු නොලැබේ.)




# "රණවිරුණ" මෙවර කලාපයේ දිවියට සුවයක් තුළින් ඔබට ගෙන එනුයේ මානසික රෝග පිළිබඳවයි

බොහෝ ශාරීරික රෝගවලට හේතු සොයා ගෙන ඇති අතර එම රෝග විෂබීජ හෝ වෛරස වැනි ක්ෂුද්‍ර ජීවීන් නිසා බෝවන බැව් කවුරුත් දනිති. එහෙත් මානසික රෝග බොහොමයකට හේතු තවමත් සොයා ගෙන නොමැති අතර සමහර මානසික රෝගවලට ප්‍රවේණි සාධකය (ආරය) තරමක් දුරට බලපාන අතර මත්පැන් භාවිතය හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, පරිසර විෂමතාවන්, අස්වාභාවික මානසික තත්ව සඳහා බලපාන අතර තවත් බරපතල මානසික රෝග කොට්ඨාශයක් මොළයේ සෛලවල ජෛව රසායනික වෙනස්වීම් නිසාද ඇතිවන බව සොයා ගෙන ඇත. මානසික රෝග පහත සඳහන් පරිදි ප්‍රභේද කළ හැකිය.

**සයිකෝසියා** (PSYCHOSIS)

උග්‍ර මානසික රෝග පද්ධතියකි. පෞරුෂත්වයේ වෙනස්වීම් සිදුවේ. ප්‍රතිකාර සඳහා රෝහල්ගත කළ යුතු වේ. තැනට සුදුසු ආකාරයකට හැසිරීම අපහසුය.

බලෙන් ප්‍රතිකාර ලබා දිය යුතු වේ. මිත්‍යා විශ්වාස හා ග්‍රන්තිය යන රෝග ලක්ෂණ බොහෝ විට දක්නට ලැබේ.

සයිකෝසියා ප්‍රධාන මානසික රෝගයකි. මෙය අනු ප්‍රභේද කිහිපයකට බෙදා දැක්විය හැක.

(අ) හේතු නොදත් සයිකෝසියාව (Functioal psychosis) ප්‍රධාන කොටස් දෙකක් හඳුනාගත හැක. එනම්,

- සිෂෝපේනියා (Schizophrenia),
- මැනික් ඩිප්‍රෙසිව් සයිකෝසියා (Manic Depressive psychosis)

(ආ) ඉන්ද්‍රියගත සයිකෝසියාව (Organic psychosis) ප්‍රධාන කොටස් කිහිපයකට වර්ග කළ හැක.

- තීව්‍ර විභ්‍රමය (Acte Delirium)
- උපතීව්‍ර විභ්‍රමය (Sub - Acte Delirium )
- ඩිමෙන්ෂියා (Dementi)

**නියුරෝසියාව**

සුළු මානසික රෝගී තත්වයකි. පෞරුෂත්වයේ වෙනස්වීම් එතරම් දක්නට නැත. ප්‍රතිකාර සඳහා රෝහල්ගත කිරීම අවශ්‍ය නැත. තැනට සුදුසු ආකාරයට හැසිරීමට හැක. කැමත්තෙන්ම ප්‍රතිකාර ගැනීමට පැමිණේ. (තමා රෝගයකින් පෙළෙන බව දනී) මිත්‍යා විශ්වාස හා ග්‍රන්තිය යන රෝග ලකෂණ දක්නට නැත .

මෙය සුළු මානසික රෝග ගණයට වැටෙන අතර පහත සඳහන් ආකාරයට ප්‍රභේද කළ හැක. ප්‍රධාන සුළු මානසික රෝග හතරකි.

1. මායා රෝගය (Hysteria)
2. ග්‍රස්ථය තත්වය (Obsessional state)
3. භීතිකාව (Phobic state)
4. කාංසා තත්වය (anxiety state)

සුළු මානසික රෝගද පහත පරිදි වර්ග කිහිපයකට වෙන් කර දැක්විය හැක.

1. පෞරුෂත්ව විෂමතා (Personality Disorders)
2. මදිරාබාධය හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම (Alcoholism and Drug Addiction)
3. අපස්මාරය (Epilepsy)
4. බුද්ධි හීනතාව (Mental subnormality)
5. මනෝ කායික රෝග (Psychosom atic ILlness)
6. ලිංගික විෂමතා (Sexual Disorders)
7. ළමා මානසික රෝග (Child Psychiarric Disorders)

මානසික රෝග අතරින් උග්‍රතම මානසික රෝගයක් වන සිෂෝපේනියා (Schizophrenia) පිළිබඳව සලකා බලමු.

**සිෂෝපේනියා** :- (Schizophrenia)

මෙම රෝගය සිංහලෙන් භින්නෝන්මාදය ලෙස හඳුන්වයි. මෙහි අර්ථය "බිඳුණු සිත් " යන්නය. "ඩිමෙන්සියා ප්‍රීකොන්ස්" යන නමින්ද මෙම රෝගය හඳුන්වා ඇත. මෙහි ප්‍රධාන ප්‍රභේද හඳුනාගත හැක.

**සරල සිෂෝෆේනියා :-** (Simple Schizophrenia)

මෙම රෝගීන් ප්‍රජාවේ ජීවත් වේ. මොවුන් සමාජ විරෝධී වැඩවලටද කිසිම තැකීමක් නොමැතිව පෙළඹේ. සම්පූර්ණ සුවය ලැබීම විරලය. වැරහැලි ඇඳගෙන ඉබාගාතේ ඇවිදින අය ඔබ දැක ඇත. මොවුන් Schizophrenia රෝගීන්ය.

**හර්බපෙනික් සිෂෝෆේනියා** :-
(Hebephrenic Schizophrenia)

මොවුන් ජීවිත කාලයම මානසික රෝහලක ගත කරයි. චිත්තවේග මොටවීම, හුදෙකලාව දෙඩවීම. අපිරිසිදුබව, බාහිර ප්‍රබෝධකයක් නොමැතිව කොක් හඬලා සිනාසීම මොවුන්ගේ රෝග ලක්‍ෂණ වේ.

**කැටටොනික් සිෂෝෆේනියා**:-(Catatonic Schizophrenia)

හදිසියේම උග්‍ර ආකාරයක් ඇති වේ. ශරීරය දරදඬුවීම, උග්‍ර අවිවේකීබව ප්‍රධාන ලක්‍ෂණ වේ.

**පැරනොයිඩ් සිෂෝෆේනියා :-**(Paranoid Schizophrenia)

මෙම රෝග ප්‍රභේදය බොහෝවිට මැදිවියේදී ඇතිවන්නකි. සැකය ප්‍රධාන රෝග ලක්‍ෂණය වේ. ආහාර පානවලට මඩ දමා ඇතැයි සැක කිරීම, පිටස්තර අය තමා ගැන අපහාසාත්මක ලෙස කතා කරනවා යැයි සැක සිතීම, මොවුන් බලෙන් රෝහල්ගත කළ යුතු අතර බැලු බැල්මට රෝගියෙකු ලෙස නොපෙනේ. Schizophrenia රෝගීන්ට දීර්ඝකාලීනව ප්‍රතිකාර කළ යුතුය.

**සිෂෝෆේනියාව** ලෝකයේ ඕනෑම ජාතියකට පොදුවන හා යෞවන වයසේදීම වැළඳිය හැකි රෝගයකි. මෙය මානසික රෝගවල පිළිකාව ලෙසද හැඳින්විය හැකි තරමටම අවදානම් බැවිනි. කල්වේලා ඇතිව සොයාගෙන වෛද්‍ය උපදෙස් අනුව නොකඩවා ප්‍රතිකාර කළහොත් රෝගය බොහෝදුරට සුවකළ හැකි අතර, ප්‍රමාදවී ප්‍රතිකාර ලැබෙන හෝ ප්‍රතිකාර නියමාකාරයෙන් නොගන්නා අයගේ රෝග තත්වය නිදන්ගත වී සදාකාලිකවම රෝහල්ගත කර තැබීමටද සිදු වේ. ලෝක ජනගහනයෙන් 1% පමණ මෙම රෝග තත්වයෙන් පෙළෙන අතර මෙයට ස්ථිර හේතු සොයාගෙන නැත. පරම්පරාගතව මෙම රෝගය ඇතිවිය හැකි බවට සාධක තිබෙන අතර දෙමාපියන් දෙදෙනාම මෙම රෝගයෙන් පෙළෙන්නේ නම් දරුවන් හට මෙම රෝග තත්වය වැළඳීමේ ප්‍රවණතාව වැඩි බැව් සොයා ගෙන ඇත.

**මෙම රෝගීන්ගේ පූර්ව රෝග පෞරුෂත්ව ලක්‍ෂණ.**

මේ අය අන්තර්ගතික පෞරුෂ ඇත්තෝ වෙති. මෙය ෂිසොයිඩ් පෞරුෂත්වය (Schizoid Personality) ලෙසද හඳුන්වයි. සිහින් ශරීර ඇති අය, සමාජ ආශ්‍රයට වැඩි කැමැත්තක් නොදක්වන, ලැජ්ජාශීලී ගතිපැවතුම් ඇති, තනිවම සිටීමට කැමති, ක්‍රීඩා විනෝදාංශවලට වැඩි ආශාවක් නොදක්වන අය වේ. මේ අයගේ සිහින් සිරුරු ඇස්තනික් බිල්ට් (Asthenic Built) යැයි ඉංග්‍රීසියෙන් හඳුන්වනු ලබයි. සිතුවිලි හා අදහස්වල අවුල් සහගත තත්වය ඇතිවීම මෙහි ( Thought Disorder) මූලික ලක්‍ෂණය වේ.



**අ.** සිතෙහි අදහස් හිරවී ඇති ගතියක් ඇතිවීම, කතාකරගෙන යන අවස්ථාවේම හිටිඅඩියේ කතාව නතරවීම. (Thought Block)

**ආ.** අදහස් හිඟයි. (Poverty of Thought)
**ඇ.** තම සිතේ අදහස් පිටස්තර බලවේගයක් විසින් ඇදගන්නවා යැයි හැඟීම. (Thought Withtrowal)

**ඈ.** තම සිතට ඇතිවන යම් අකාරයක අදහසක් පිටස්තර බලවේග විසින් ඇතුළු කරනවා යැයි හැඟීම. (Thought Insertion)

**ඉ.** ඉර හඳ හා අභ්‍යවකාශය වැනි බාහිර බලවේගයන් තම අදහස් පාලනය කරනවා යැයි හැඟීම. (Passivity Feelings)

Schizophrenia රෝගයේ ප්‍රධාන රෝග ලක්ෂණයක් ලෙස භ්‍රාන්තිය හඳුන්වයි. පංචේන්ද්‍රියටම බලපාන හා බාහිර ප්‍රබෝධකයන්ගෙන් තොර වින්දනය භ්‍රාන්තිය නම් වේ. එහි ප්‍රධාන ලක්‍ෂණ කිහිපයකි.

- දෙවියන්, භූතයන් කතා කරනවා හෝ බැනීම වැනි ශබ්ද ඇසීම. (Auditory Haliucinations)
- දෙවියන්, භූතයන්, මිය ගිය අය හෝ තමාට සතුරන් පහර දෙනවා යැයි පෙනීම. (Auditory Haliucinations)
- දිවට මිහිරි - අමිහිරි රසක් දැනීම. (Gustatory haliucinations)
- විවිධ ගඳ සුවඳ දැනීම. (Difactory haliucinations)
- තම ශරීරයේ කුඩා සතුන් දුවන්නාක් හෝ ශරීරය ස්පර්ශ කරනවා යැයි සංවේදනය වීම. (Haptic haliucinations)

**චිත්තවේගයන් මොටවීම.**

මෙම රෝගයෙන් පෙළෙන්නන් හට චිත්තවේගයක් නොමැතිව සාහසික අපරාධ වුවද කළ හැකිය. එනම් චිත්තවේගයන් හා අදහස්වල පරස්පර විරෝධතාවක් හටගනී. උදා:- දුකේදී සතුටුවීම, සතුටේදී දුක්වීම අවමංගල්‍යයකදී ඉතා ප්‍රීතියෙන් හැසිරීම.

ඉතිරිය 38 පිටුවට ...





# සුවපත් දිවියට ආයුර්වේද අත්වැල

# වදමල් ශාකයේ ඖෂධීය වැදගත්කම 14



ආචාර්ය කෞමදි කරුණාගොඩ මිය.
B.A.M.S (Hons) Sri Lanka, MS (Gyn & Obs) India, PhD (UOC)
විශේෂඥ වෛද්‍ය - ප්‍රසව හා නාරිවේද (ආයුර්වේද)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දේශීය වෛද්‍ය විද්‍යාතනය
කොළඹ විශ්වවිද්‍යාලය.

## වදමල්වල ඖෂධීය ගුණය

වදමල් හෝ සපත්තු මල් ලෙස දේශීයව හඳුන්වන සෑම පරිසරයකම දැකිය හැකි මෙම ශාකය මෑතක සිට ඖෂධීය ගුණයත් වාණිජමය වටිනාකමත් හේතුවෙන් වැඩිවැඩියෙන් ජනප්‍රිය වෙමින් පවතී. පුරාණයේ සිට අප ශ්‍රී ලාංකිකයන්ට මෙම ශාකයේ උපයෝගීතාව එතරම් නුහුරු නොවුනත් වර්තමානයේ අලුතින් හඳුනාගෙන ඇති උපයෝගීතාව සමග එහි වටිනාකම හා භාවිතයන් වඩා විධිමත්ව හඳුනා ගැනීම වැදගත් යැයි සිතේ.

## වදමල් ශාකයේ ඖෂධීය වැදගත්කම

අප රට තුළ අතීතයේ පටන් වදමල්වල ඖෂධීය භාවිතය දේශීය වෙදකම තුළත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළත් පැවැති කරුණු මතින් ගොඩනැගී තිබුණි. මෑතකාලීනව ස්වාභාවික ආහාරපානවලට යොමුවීම හේතුවෙන් වදමල් පානය පිළිබඳ කතාබහ ජනප්‍රිය වෙමින් පවතී. ආයුර්වේදය හා දේශීය වෙදකම තුළ ඖෂධයක් ලෙස භාවිත වනුයේ වෙල්චිලි, බඩවැටි ආශ්‍රිතව දක්නට ලැබුණු රතු පොකුරු වදමල් විශේෂයයි.





## වදමල් ශාකය පිළිබඳ දැනුවත් වෙමු

මෙම ශාකය ඝර්ම කලාපීය රටවලට ආවේණික වූ ශාකයකි. ලොව පුරා උණුසුම් දේශගුණයක් පවතින රටවල මෙම ශාකය පැතිර පවතී. පළල් පත්‍ර සහිත මධ්‍යම ප්‍රමාණයේ ශාකයක් වේ. අවුරුද්ද පුරා මල් පුබුදුවන ශාකයක් හෙයින් ගෙවතු අලංකරණයට වැඩි වශයෙන් වගා කරයි. මෙහි පෙති පහක් සහිත මල් මෙන්ම පෙති වැඩි වශයෙන් ඇති මල් ප්‍රභේද ද පවතී. රතු, සුදු, රෝස, කහ, තැඹිලි, දම් ආදී ලෙස විවිධ වර්ණවලින් සමන්විත මල් ප්‍රභේද දක්නට ඇත.

වදමල් ශාකය හයිටි රාජ්‍යයේ ජාතික සංකේතයයි. සොලමන් දූපත්, දකුණු කොරියාව, මැලේසියාව, හවායි දූපත් යන රටවල ජාතික පුෂ්පය ලෙස මෙහි විවිධ ප්‍රභේද භාවිත කරයි. හවායි දූපත්වල සංස්කෘතික අංගයක් ලෙස ආදරය, සතුට, සාමය සංකේතවත් කිරීමට වදමල උපයෝගී කරගනී.

මෙම ශාකය ගෘහ අලංකරණයට යොදාගන්නා වද ප්‍රභේදවලට වඩා ශක්තිමත් ශාකයක් වන අතර පත්‍ර මෙන්ම පුෂ්පයේ පෙතිද ශක්තිමත් ස්වභාවයක් ගනී.

ආයුර්වේදයට අනුව මෙම වදමල් පානයෙහි විවිධාකාර ඖෂධීය ගුණ අඩංගුය. සාමාන්‍ය තුවාල, පිළිසුම් තුවාල සුවකිරීමේ හැකියාව පවතී. පෙනහළු ආශ්‍රිත ගැටලුවලට ගුණදායකය. සෙම් කොටස් දියකර හරී.

වදමල්වල ඖෂධීය වටිනාකම පිළිබද සිදුකර ඇති විද්‍යාත්මක පරීක්ෂණ පිළිබඳව විමසා බලමු.

## අධිරුධිර පීඩනය පාලනය

වදමල් පානය ආශ්‍රිතව කළ සායනික පරීක්ෂණ මගින් එහි පවතින අධිරුධිර පීඩනය පාලනය කිරීමේ හැකියාව හඳුනාගත හැක. මෙම හැකියාව අධිරුධිර පීඩනය සඳහා දෙන ඖෂධ තරම්ම ප්‍රබල නොවේ.

එනම් අධිරුධිර පීඩනය ඇති පුද්ගලයෙකුට ඖෂධ නවතා මෙවැනි ශාකමය ආදේශක නිර්දේශ කිරීමක් අනුමත කළ නොහැක. ගත යුතු අදහස වනුයේ එබඳු රෝගයකින් පෙළෙන්නෙකුට ගතහැකි සුදුසු පානයක් ලෙස මෙය නිර්දේශ කළ හැකි බවයි.

**පිළිකා රෝගීන් සඳහා**

වදමල් පෙති යුෂ යොදාගෙන සතුන් සමග කළ පර්යේෂණවලදී එහි පවතින පිළිකා සෛල මර්ධනය කිරීමේ හැකියාවක් නිරීක්ෂණය වී ඇත. එනම් පිළිකා සෛල තවදුරටත් පැතිරීම පාලනය කිරීමේ ශක්තිය පෙන්නුම් කරයි. කෙසේ වෙතත් මෙම පරීක්ෂණ තවමත් මූලික මට්ටමේ පවතින අතර ස්ථිර කිරීම සඳහා වන පරීක්ෂණ තවදුරටත් කළ යුතුව පවතී.

**හිසකෙස්වල නිරෝගීබව**

වදමල් පෙති, වදමල් පත්‍රවලින් සාදාගනු ලබන ආලේපන, තෙල් වර්ග හිසකෙස්වල නිරෝගීබව වැඩිදියුණු කරගැනීම සඳහා භාවිත කරයි. හිසකෙස් හැලීම පාලනය සඳහාත්, තට්ටය පෑදීම වළක්වාලීම සඳහාත්, මෙහි ඇති හැකියාව පිළිබඳව සොයා බැලූ පර්යේෂණ දැනට පවතී. එමෙන්ම අකලට හිසකෙස් සුදුවීම පාලනයට වර්ණ ප්‍රතිඔක්සිකාරක හා විටමින් වර්ගවලට බලපෑම් කළ හැකිබව විශ්වාස කරයි.

**හිසකෙස්වල නිරෝගීබවට භාවිත කළ හැකි පහසු හිස ගල්වන ආලේපනයක්.**

**රතු පොකුරු වදමල් 01 ක්**
**වදමල් පත්‍ර 3,4 ක්**
**මුදවපු කිරි මේස හැඳි 04 ක්.**

**වදමල් පෙති හා කොළ සිහින්ව කොටා තලපයක් වූ පසු එයට මුදවපු කිරි එක්කර ගෑරුප්පුවකින් හොඳින් මිශ්‍ර කරන්න. මෙම ආලේපය හිස් කබල හා හිසකෙස්වල හොඳින් තැවරෙන සේ ආලේපකර පැයක් තබන්න. පසුව මද උණුසුම් ජලය හා ශාකසාර ෂැම්පු වර්ගයක් භාවිත කර සෝදා හරින්න. සෙම් ගතිය වැඩි පුද්ගලයන් සඳහා හිරුඑළිය සහිත උදේ වරුවක භාවිතය වඩාත් සුදුසු වේ.**

වදමල් ශාකය ආයුර්වේදයේ 'ජපා' ලෙස හඳුන්වන අතර එහි පුෂ්ප 'ජපා' පුෂ්ප නම් වේ. මෙහි ඖෂධීය වටිනාකම සටහන් කිරීමේදී එය හෘදයට හිතකර බවත්, හිසකෙස් වැඩීම උත්තේජනය කරන බවත්, වයස්ගතවීම පාලනය කරන බවත් සඳහන්ව ඇත. එමෙන්ම වදමල් තලපය එලඟිතෙල් හා මිශ්‍රව භාවිතය ලේ යන අර්ශස් සඳහා ගුණදායකබව නිර්දේශ කරයි. මාස්වීම වැඩිපුර පවතින අවස්ථාවල මී පැණි තේ හැන්දක් යොදා වදමල් පානය දවසට වරක් හෝ දෙවරක් භාවිත කිරීම ගුණදායකය. මෙම පානයම ලේ යන අර්ශස් රෝගීන්ටද රෝග තත්වය පාලනය සඳහා භාවිත කළ හැක.

**ස්වභාවික වදමල් පානය පිළියෙල කිරීම.**

**රතු පොකුරු වදමල් හෝ සපත්තු මල් ලෙස නම් කරන පෙති 5 ක් සහිත රතු පැහැ වදමල් 3,4 ක් තෝරා ගන්න. නැවුම්ව නෙලා ගත් මල් භාවිතය, පානයේ ගුණාත්මකබව ඉහළ නංවයි. මලෙහි පෙති වෙන් කර සෝදා පිරිසිදු කර (ලුණු දිය කළ සාමාන්‍ය ජලය පිරි බඳුනක පෙති ගිල්වා මද වේලාවක් තැබීමෙන් කෘමීන් හා අන් කුඩා සතුන් ඉවත් කිරීමට උපකාරී වේ.) ජලය හොඳින් නටවන්න. පිරිසිදු කරගත් මල් පෙති ගැඹුරු බඳුනක බහා එයට නටවා ගත් ජලය වත්කරන්න. ( මි.ලී. 500 ක් පමණ) හොඳින් කලතා විනාඩි 5 ක් පමණ වසා තබන්න. වර්ණවත් වූ ද්‍රව්‍ය පෙරා වෙන්කර ගන්න. මෙම පානය, මී පැණි, සීනි හකුරු වැනි රස කාරකයක් සමඟ හෝ එලෙසින්ම පිළිගැන්විය හැක. උණුසුම් පානයක් ලෙස පිළිගැන්වීමේදී දෙහි කැබැල්ලක් සමඟ පිළිගන්වන්න. තද උණුසුම් දියරයන්ට දෙහි එකතු කිරීමේදී එහි ඇති සී විටමිනය විනාශවන හෙයින් බීමට ඉතා ආසන්න විට දෙහි දැමීම වඩා යෝග්‍ය වේ. මෙය ශීත කළ පානයක් ලෙසද ප්‍රණීත වේ. වඩා සුදුසු වන්නේ පිළිගැන්වීමට ආසන්නව නැවුම්ව පිළියෙල කරගැනීමය.**

මල් අභාවයේ හෝ කල් තබා ගත හැකි නිෂ්පාදනයක් ලෙස පිළියෙල කිරීමට නම් ක්‍රම දෙකක් අනුගමනය කළ හැකිය.

01. හොඳින් පිපුණු මල්වල පෙති මද පවනේ වියලා හෝ විජලනයට ලක් කර ගබඩා කිරීම .

02. උණු ජලය යොදා සාදාගත් ද්‍රව්‍ය සීනි දමා නැවත උණුකර පැණියක් ලෙස සකසා බෝතල් කර හෝ ශීතකරණයක් ආධාරයෙන් කල්තබා ගැනීම .

විවිධ කෘත්‍රිම වර්ණක රසකාරක භාවිතකර නිෂ්පාදනය වන පානවර්ගවලින් මිදී මෙවැනි ඖෂධීය ගුණයක් සහිත, ආකර්ෂණීය ස්වභාවික වර්ණයකින්ද සමන්විත දේශීය ස්වභාවික පානවර්ගවලට අප සමාජය යොමු කිරීම අනාගත පරපුරටද නිරෝගී දිවිපෙවෙතක් උරුමකර දීමට මෙය හොඳ ආරම්භයක් වනු ඇත.



# සංස්කෘතිය කලාව උරුමය හා වීරත්වය

## ස්තූප වර්ගීකරණය ( 2 කොටස )

**මූලාශ්‍ර හා ඓතිහාසික සාධකයන්ට අනුව ස්තූප වර්ගීකරණය**

පැරණි යුගයේ සිට පැවත එන චෛත්‍ය ඇසුරින් බහුතරයක් ගොඩනැගූ අවස්ථාවේ තිබූ ස්වරූපයෙන්ම හමුවී නොමැත. එනම් විවිධ ආක්‍රමණ හා පාරිසරික සාධක මත බොහෝමයක් නටඹුන් බවට පත්වී තිබේ. මේ නිසා මුල්කාලීන ස්තූපවල හැඩය, වර්ණය, විකාශය, නිරීක්ෂණය හා නිර්ණයකිරීම් තරමක් දුෂ්කර කාර්යයකි. කෙසේ නමුත් ඉන්දියාවේ පිහිටි සාංචි, භාරුත් වැනි ස්තූපවල තොරණ සහ ගරාදි වැටවල් ආශ්‍රිතව දක්නට ලැබෙන කැටයම් අතර ස්තූප සහිත කැටයම් හඳුනාගත හැක. මීට අමතරව පැරණි ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍ර සහ විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සංචාරය කළ පුද්ගලයන්ගේ විස්තර මගින්ද ඓතිහාසිකව පැවති ස්තූප පිළිබඳව අවබෝධයක් ලබාගත හැක. වර්තමානය වන විට ඉතිරිව පවතින ස්තූප අතරින් පැරණිතම නිර්මාණයක් ලෙස අශෝක අධිරාජ්‍ය සමයේදී නිර්මාණය කළ සාංචි ස්තූපය දැක්විය හැක.

පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යමය වශයෙන් පවතින සාධක මත පුරාවිද්‍යාඥයින් සහ ඉතිහාසඥයින් විවිධ ආකාරයේ ස්තූප වර්ගීකරණයන් ඉදිරිපත් කොට තිබේ. විශේෂයෙන් මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගේ විසින් රචිත “ස්තූප” නම් ග්‍රන්ථය තුළ ස්තූප වර්ග 4 ක් දක්වා තිබේ. එනම්,

**1. තැන්පත් කර ඇති ශාරීරික ධාතු අයත් උත්තමයන්ට අනුව වර්ග කිරීම.**

**2. තැන්පත් කර ඇති ශාරීරික ධාතුවලට අමතරව තැන්පත් කර ඇති ප්‍රධාන පූජනීය වස්තු අනුව වර්ග කිරීම.**

**3. ආකෘතිය නැත්නම් ස්තූපයේ හැඩය අනුව වර්ග කිරීම.**

**4. ස්තූප සංකේත අනුව වර්ග කිරීම.**

ස්තූපයේ තැන්පත් කර ඇති ශාරීරික ධාතු අයත් උත්තමයන් අනුව වර්ග කිරීම. පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් පරිදි ස්තූපයක ධාතු තැන්පත් කර වන්දනා කළ යුතු උත්තමයන් වර්ග කරයි.

1. සම්මා සම්බුද්ධ (බුදුවරයෙකු වෙනුවෙන්)

2. පච්චේක බුද්ධ (පසේ බුදුවරුන්) - ධර්මය අවබෝධ කර ගත් එහෙත් අන් අයට ධර්මය දේශනා කිරීමට හැකියාවක් නොමැති බුදුවරුන්

3. අරහත් ( රහතන් වහන්සේලා)

4. චක්‍රවර්තී රජ (අධිරාජ්‍යයෙකු වෙනුවෙන්)

මීට අමතරව ක්ෂුද්‍රක වස්තුව නම් ග්‍රන්ථයට අනුව උත්තමයන් 7 දෙනෙකු වෙනුවෙන් ස්තූප ඉදිකළ යුතු බව දක්වා තිබේ.

1. තථාගත
2. පච්චේක බුද්ධ (පසේබුදු)
3. අරහත්
4. අනාගාමී
5. සකෘදාගාමී
6 සෝතාපන්න (සෝවාන්)
7. ගෘහස්ථ (ගිහි උත්තමයන්)

මේ අයුරින් අපට මෙරටින් සහ ඉන්දියාවෙන් හමුවන ස්තූප තැන්පත් කර ඇති ධාතූන් වහන්සේලා අයත් පුද්ගලයන් අනුව වර්ගීකරණය කර ගත හැකිය.

**ස්තූපවල තැන්පත් කර ඇති වස්තු අනුව වර්ග කිරීම.**

මෙම වර්ගයට අයත්වන චෛත්‍ය වර්ග 5 ක් පිළිබඳව සද්ධර්මරත්නාකරයේ පහත පරිදි දක්වා තිබේ.

1. ශාරීරික
2. පාරිභෝගික
3. උද්දේශික
4. චර්ම
5. තතු

ආරම්භක අවදියේදී ලොව පැවතියේ ශාරීරික කොටස් තැන්පත් කළ ස්තූප පමණකි. එයින් අදහස් කරනු ලබන්නේ නොයෙකුත් අස්ථි කොටස්, නිය, කෙස් වැනි ශාරීරික කොටස්ය. පසුකාලීනව බුදුන් වහන්සේ පාරිභෝජනය කළ වස්තූන්ද තැන්පත් කර ඉදිකළ ස්තූප

මෙරටින් හමුවේ. සද්ධර්මරත්නාකරයට අනුව මහසෙන් රජු බුදුන් වහන්සේගේ ඉනට බැඳි පටියේ කොටස් තැන්පත් කර ජේතවන ස්තූපය කරවන ලදී. බුදුන් වහන්සේගේ සිවුරෙන් කොටසක් තැන්පත් කොට කැළණිය ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ සිවුරු දාගැබ පිළිබඳව 15 වන සියවසට අයත් සැළලිහිණි සංදේශයේ සඳහන් වේ.


චර්ම ධාතු යනු මහායාන සම්ප්‍රදායට අයත් ධර්ම කොටස් ඇතුළත් කවර , සන්නස් , පත්තිරු තැනපත් කොට ස්තූප කරවීමයි. ඉන්දියාවේ නගර්පුර්, මධිනමනි ස්තූපවලින් “යේ ධම්මා හේතුප්‍රභවා” යන්න ඇතුළත් බැමි පුවරු හමුවී තිබේ. ශ්‍රී ලංකාවේ මිහින්තලයේ පිහිටි ඉඳිකටුසෑයේ ධර්ම කොටස් ඇතුළත් තඹ තහඩු 15 ක් හමුවී තිබේ. එහෙත් ශ්‍රී ලංකාව තුළ බහුලව හමුවන්නේ ශාරීරික ධාතූන් වහන්සේලා තැන්පත් කොට ඉදිකරන ලද ස්තූපයි. බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින්නේද ලංකාව තුළය.



මහියංගන චෛත්‍යය



ථූපාරාමය



මිහින්තලය



සේල චෛත්‍යය

- ග්‍රීවා ධාතුව/කේෂ ධාතු - මහියංගන චෛත්‍යය
- දකුණු අකු ධාතුව - ථූපාරාමය
- ඌර්ණ රෝම ධාතුව - සේල චෛත්‍යය
- ලලාට ධාතූ - සේරුවිල චෛත්‍යය
- වම් දන්ත ධාතු - දළදා මැදුර
- කේෂ ධාතු - ගිරිහඬු සෑය
- දකුණු දන්ත ධාතු - සෝමාවතී දාගැබ
- ද්‍රෝණයක් පමණ ධාතු - රුවන්වැලි මහා සෑය

පරිනිබ්බාන සූත්‍රයේ දක්වන ආකාරයට මෙම ධාතූන් වහන්සේලාද සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 5000 ක් ගිය තැන (ස්වයං පරිනිර්වාණයක්/ස්වයං ආදාහනයක්) පරිනිර්වාණයට පත්වනු ඇත.




දළදා මැදුර



ගිරිහඬු සෑය



සෝමාවතී දාගැබ



රුවන්වැලි මහා සෑය



**කථිකාචාර්ය රන්දුනු විදුල සොයිසා**

MBA (Gloustershira - UK)
BA (SP) (Usjp)
Post Graduate Dip in Tourism & Hospitality Management (Othm)

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Principal Staff Officer
HQ SLAVF
Brigadier
MM Salwatura RWP RSP USP



Brigadier Administration
HQ SLAVF
Brigadier
BMRJ Bandara



Brigadier Coordinating
SF HQ (EAST)
Brigadier
JMTNB Karunathilaka



Recruiting Officer
HQ SLAVF
Colonel
NHJM Nawarathne



Colonel Welfare
HQ SLAVF
Colonel
LWADS Wickramasinghe



Colonel Training
HQ SLAVF
Colonel
TSBR Fernando



Commanding Officer
1 SLAPC
Lieutenant Colonel
RPCN Payatisa ISC



Commanding Officer
2 (V) GR
Lieutenant Colonel
W Warnakulasooriya



Sport Officer - HQ SLAVF
Major
CA Wijesekera



Commanding Officer
19 SLNG
Major
PSR Perera



Commanding Officer
2 (V) SLLI
Major
AGN Dhanasiri



Commanding Officer
7 (V) CES
Major
MPS Nadeeshan LSC

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Commanding Officer
5 (V) SLSR
Major
BGJ Premathilaka



Commanding Officer
14 (V) GW
Major
HDMAP K Dissanayake



SO 2 ( Grievaces )
HQ SLAVF
Major
MAADCP Munasinghe
RSP USP psc



2 nd In Command
9 SLNG
Major
AWB Shanthalal



2 nd In Command
15 (V) SLSR
Major
PKRIJ Dissanayake



2 nd In Command
12 SLNG
Major
WKDI Rathnapala



2 nd In Command
3 (V) SLSR
Major
KMNSS Karunanayake psc



2 nd In Command
17 (V) SLSR
Major
SNAP Dias



2 nd In Command
9 (V) SLLI
Major
LI Ambagahaduwa



2 nd In Command
1 SLAPC
Major
AMPD Attanayake



SO 2 ( Posting )
HQ SLAVF
Major
ASL Attanayaka psc



Adjutant
2 (V) SLAMC
Captain (QM-TEC)
Captain KGDR De Silva

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Int Officer
14 (V) GW
Lieutenant
KGTS Ranawara



Int Officer
3 (V) SLSR
2 Lieutenant
HMKC Disanayaka



Adjutant
13 SLNG
2 Lieutenant
TS Palliyaguru




Adjutant
19 SLNG
2 Lieutenant
RJ Kannangara



Regmental
Sergent Major
11 (V) SLSR
WO I MMK Nimalsiri
Bandara



Regmental
Sergent Major
4 (V) SLACAL
WO I HMI Herath Bandara



Deputy Commandant
Chief Clerk
HQ SLAVF
WO I Hathurusinghe



Chief Clerk
11 (V& SLSR
Sgt Wijerathna AMPGR

## දිවියට සුවයක් ... 27 පිටුවෙන්

**දෙනු ලබන ඖෂධ :-**

පීනොතයිසින් (Phenothiazine Drugs) ගණයට අයත්

1. ස්ටෙලයින්
2. ලංගැක්ටිල්
3. මෙලරිල්
4. ස්පාරින්
5. පී මොසයිඩ්

මෙම ඖෂධ වෛද්‍ය නිගමනය අනුව දීර්ඝකාලීනව දියයුතු වේ. පීමෝසයිඩ් ගණයට අයත් නොවන හැලෝ පෙරිඩෝල් නොහොත් සිරිනේසි ඖෂධයද මෙම රෝගීන්ට ලබාදේ. මෙම ඖෂධ ලබාදෙන විට පාකින්සන් රෝග ලක්‍ෂණ ඇති වේ.

**පාකින්සන් රෝග ලක්‍ෂණ** (Parkinson' s Symptoms)

දිව, තොල් හා ඇඟිලි වෙව්ලීම, කෙළ වැගිරීම, අත්පාවල මාංශපේෂීන්ගේ තද බව හා චිත්තවේග ප්‍රකාශ නොවන මුහුණු (Mask Like Face ) ආදියයි.

පාකින්සන් රෝගීන් වෙනුවෙන් දෙනු ලබන ප්‍රතිකාර

- විදුලි කම්පන ප්‍රතිකාර (Electric Convulsive Therópy)
- වෘත්තීය ප්‍රතිකාර (Occupational Theropy)

එලදායී වැඩක හෝ අභ්‍යාසයක යෙදවීම, ක්‍රීඩා හෝ විනෝදාංශවලට යෙදවීම මෙයින් අදහස් කෙරේ. රෝගීන්ට හා නෑදෑයින්ට ලබාදිය යුතු සෞඛ්‍ය උපදෙස්


1. රෝගියා හුදෙකලාව හෝ අලසව සිටීමට ඉඩ නොතබන්න
2. යම් ලදායි වැඩක නිරත කරවීම
3. රෝගියා හාස්‍යයට ලක් නොකිරීම
4. සාමාන්‍ය පුද්ගලයෙකු සේ සැලකීම



සැකසුම :-
බනි 1 කේච්චිකේ ජයවික්‍රම යුඑස්පී
පුහුණු හෙද
ශ්‍රීලංයුහසෙව්බමු

# ප්‍රහේලිකාව

15




## හරහට

1. මහගම සේකරයන්ගේ ප්‍රසිද්ධ කවි පොතකි.
3. පරිණාමවාදය පිළිබඳ විමසීමේදී මෙම නාමය විශේෂ වේ.
4. දේවල් කිහිපයක සම්බන්ධතාව පිළිබිඹු කරන ගණිත කර්මයකි.
5. අපායට කියන වෙනත් නමකි.
6. පැවිද්දාට සිව් පසයෙන් සංග්‍රහ කරන්නේ ..... ජනතාවයි.
8. මහෞෂධ පණ්ඩිතයන් ප්‍රඥාවෙන් ..... පැමිණ තිබුණි.
11. ඒ.ආර් ..... ජාත්‍යන්තර සම්මානලාභී ඉන්දියානු සංගීත අධ්‍යක්ෂකවරයෙකි.
12. පසුගියදා නාරාහේන්පිට හමුදා රෝහලේදී සිදුකළ වකුගඩු ආශ්‍රිත සැත්කම ..... වාර්තාවකි.

## පහළට

1. සිනහ උපදවන කලාවන් මේ ගණයට වැටේ.
2. රටකට දැරිය හැකි සංවර්ධනය මෙසේ හඳුන්වයි.
4. කඳු යන වචනයට සමාන පදයකි.
7. බෞද්ධ පුනරුද සමයේදී අනගාරික ධර්මපාලතුමා සමග කටයුතු කළ විදේශීය කාන්තාවකි.
8. අලියාට සාපේක්ෂ ස්ත්‍රී ලිංගික පදයයි.
9. මැදපෙරදිග පිහිටි ධනවත් රාජ්‍යයකි.
10. තත්වයෙන් උසස්බව මෙසේ හඳුන්වයි.












පළමුවන වියට පා තැබූ
හිරුන් සෙහස්න පුතුට
සු'පැතුම් පතන්නේ
සැරයන් ආනන්දසිරි ඩීඑම්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

දෙවන වියට පා තැබූ
රුදෙව් මෙත්රු පුතුට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ චතුරංග එස්පීඩී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

තුන්වන වියට පා තැබූ
රිතුම් යස්මිත් පුතුට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ සිරිවර්ධන පීඑම්ඩීඑස්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

හතරවන වියට පා තැබූ
මහීෂා දෙව්සඳිනි දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ ප්‍රියංකර ඩබ්ලිව්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම









පළමුවන වියට පා තැබූ
තනුෂ නිම්සර පුතුට
සු'පැතුම් පතන්නේ
බනි ll විපුලසේන එන්ජීඑස්එස්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

හතරවන වියට පා තැබූ
කවින්ද සත්සර පුතුට
සු'පැතුම් පතන්නේ
බනි ll විපුලසේන එන්ජීඑස්එස්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

පළමුවන වියට පා තැබූ
මනෝජ් ප්‍රසන්න පුතුට
සු'පැතුම් පතන්නේ
සැරයන් විජේරත්න
ඒඑම්පීජීආර් පියා සහ මව
ඇතුළු පවුලේ සැම

හතරවන වියට පා තැබූ
යෙනුජ ගිහන්ස පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ප්‍රදීප් කුමාර කේකේටී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



දෙවන වියට පා තැබූ
ඔනිජ ලක්නිත පුතුට
සු'පැතුම් පතන්නේ
මේජර් ඒකේකේ ද අල්විස් පියා
සහ මව ඇතුළු
පවුලේ සැම



දොළොස්වන වියට පා තැබූ
සුවිඳු වනිත්මල් පුතුට
සු'පැතුම් පතන්නේ
ව/සැරයන් රාජගුරු
ආර්පීපීසීකේ පියා සහ මව
ඇතුළු පවුලේ සැම



දහවන වියට පා තැබූ
පිලිඳු විශ්ව පුතුට
සු'පැතුම් පතන්නේ
සාසෙ රුවන්පුර ආර්ඒපී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



හතරවන වියට පා තැබූ
තුරුලි ඔමායා දියණියට
සු'පැතුම් පතන්නේ
සැරයන් පුෂ්ප කුමාර යූජීපී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



හතරවන වියට පා තැබූ
ලිතුලි සෙනුල්යා දියණියට
සු'පැතුම් පතන්නේ
ලා/කෝ සිරිවර්ධන
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
ගිමෙත් හේෂන පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් බණ්ඩාර ආර්එම්එන්ටී
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



අටවන වියට පා තැබූ
තිලක්ෂණ දෙනුවන් පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් පියසිංහ එම්ආර්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



හතරවන වියට පා තැබූ
දුලන නිම්සර පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් ගුණතිලක ආර්එම්සීඑස්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



අටවන වියට පා තැබූ
මෙතුලි දහම්සා දියණියට
සු'පැතුම් පතන්නේ
සැරයන් ප්‍රියදර්ශනී ඩබ්ලිව්එම්
මව සහ පියා ඇතුළු
පවුලේ සැම



හයවන වියට පා තැබූ
සනහස් දුල්මින් පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් පුෂ්ප කුමාර
වීපීඑස්එම් පියා සහ මව
ඇතුළු පවුලේ සැම



හයවන වියට පා තැබූ
ඔසදි දහම්සා දියණියට
සු'පැතුම් පතන්නේ
සැරයන් කුමාරසිංහ කේඩීආර්
පියා සහ මව ඇතුළු
පවුලේ සැම



අටවන වියට පා තැබූ
දහම් නිම්සද පුතුට
සු'පැතුම් පතන්නේ
කෝප්‍රල් කළුපහනගේ එන්ඒ
පියා සහ මව ඇතුළු
පවුලේ සැම

# යුග දිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
මේජර් එච්පීඑම්පීබීඑම් පලිහක්කාර ශ්‍රීලංජාආබමු
හා හංසිනි ලංකා මෙනවිය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
ලා/කෝ බණ්ඩාර ආර්එම්එස් 12 ශ්‍රීලංජාආබමු
හා එච්එම් සුගන්දිකා මෙනවිය



## කැපවීමෙන් ජයග්‍රහණය කරා

51 වන පාබල සේනාංකය වෙතින් ජුනි මස 12 වන දින සිට ජූලි මස 05 වන දින දක්වා පවත්වන ලද මූලික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව හදාරා ඉන් ප්‍රථම ස්ථානය දිනාගන්නට 15 වන ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/කිහු116297 සා/සෙ සමන් කුමාර එම්යූඑම්පීඑච්පීඒ සමත් විය. ඒකකයටද ජාතික ආරක්ෂක බළමුළුවටද ස්වේච්ඡා බළසේනාවටද කීර්තියක් අත්කරදුන් ඔහුට රණවරුණ අපද මෙසේ සුභාශිංසන එක් කර සිටිමු.



## මගේ ගෙවත්ත

පී එච් පී බී සඳමිණි
2 ශ්‍රේණිය
ගා/අක්මීමන මහා විද්‍යාලය

# අතීත මතක ...




ලංකා රයිෆල් බළකායේ ලාංඡනය දැක්වෙන ඡායාරූපයක්




ලංකා වැවිලි කරුවන්ගේ රයිෆල් බළකායේ ලාංඡනය සහිත ඡායාරූපයක්

## අධීක්ෂණය



මේජර් ජෙනරාල් එම් ටී කේ ආර් සිල්වා KSP

## උපදේශකත්වය



බ්‍රිගේඩියර්
ඩබ්ලිව් ජී පී සිසිර කුමාර RSP



කර්නල්
එච් එච් එස් පී එස් ද සිල්වා RSP USP

## සංස්කාරක



ලුතිනන් කර්නල්
එන් ඩබ්ලිව් දහනායක ශ්‍රීලංඡාආබමු

## රණවරුණ කාර්ය මණ්ඩලය

**සහය සංස්කාරක/සෝදුපත් කියවීම**
මේජර් ඩී එම් දිල්හාරා සජීවනී ජාශිබ

මා/සැ ජයතිලක එම්ඒ (සම්බන්ධීකරණය)
කෝප්‍රල් කීර්තිරත්න ඒඑච්ටීඑස්එස් (පරිගණක නිමැවුම්)
කෝප්‍රල් ධර්ම ශ්‍රී වයිඒඑස් (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් ලහිරු ඩීඑම්එන් (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල් (ඡායාරූප)
ලා/කෝප්‍රල් තෙවරප්පෙරුම අයියු (ඡායාරූප)

**රණවරුණ ලිපිනය**

සංස්කාරක,
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද්ධ හමුදා කඳවුර
සීතාවක - කොස්ගම

ඊමේල් - ranawaruna@yahoo.com
දුරකථන - 036 2255 362
වෙබ් - slavf@army.lk

මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස්



මේජර් ජෙනරාල් එස් යූ එම් එන් මානගේ WWV RWP RSP psc ජ්‍යෙෂ්ඨ නිලධාරී ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස රාජකාරී භාරගැනීමෙන් පසු ප්‍රථමයෙන් පැවැත්වූ ස්වේච්ඡා ඒකක අණදෙන නිලධාරී සාකච්ඡාව 2023 ජූනි මස 27 වන දින පැවැත්වූ අතර ඒ සඳහා සහභාගී වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සමූහ ඡායාරූපය.